කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය


கொழும்புப் பல்கலைக் கழக கணினிப் பாடசாலை

UNIVERSITY OF COLOMBO SCHOOL OF COMPUTING

UCSC



# 2011



# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# Annual Report

### කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

### අන්තර්ගතය


දැක්ම සහ මෙහෙවර ........................................ 01

අධ්‍යක්ෂක සමාලෝචනය ........................................ 01

කෙටි බැල්මක් ........................................ 03
UCSC හි පරිදර්ශනය ........................................ 06

පාලනය ........................................ 07

අධ්‍යාපනය ........................................ 09
වැඩසටහන් සහ ශිෂ්‍යයන් ........................................ 09
උපාධි අපේක්ෂක අධ්‍යාපනය ........................................ 09
පශ්චාත් උපාධි අධ්‍යාපනය ........................................ 13
බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ........................................ 14
විදේශීය ශිෂ්‍යයන් ........................................ 17
ආරම්භ කළ නව පාඨමාලා ........................................ 18

පර්යේෂණ ........................................ 18
පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන ........................................ 18
සම්මේලන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු ........................................ 19
ලද සම්මාන ........................................ 20

අධ්‍යයන කාර්ය මණ්ඩලය ........................................ 20
අනධ්‍යයන-කාර්ය මණ්ඩලය: ස්ථිර (P) කොන්ත්‍රාත්තු/පැවරුම් (C/A) ........................................ 21

මූල්‍ය ........................................ 21
පුනරාවර්තන වියදම් ........................................ 21
ප්‍රාග්ධන වියදම් ........................................ 21
ව්‍යාපෘති (දේශීය/විදේශීය අරමුදල් සැපයූ) ........................................ 22
ව්‍යාපෘති වියදම් (දේශීය/විදේශීය අරමුදල් සැපයූ) ........................................ 23
මූල්‍ය ප්‍රගතිය (වියදම්) ........................................ 23
මූල්‍ය ප්‍රගතිය (උපයාගත් ආදායම්) ........................................ 24
මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය ........................................ 24

2011 වර්ෂයේදී ලද යටිතල පහසුකම් ........................................ 25
වෙනත් විස්තර / මෙම වාර්තාවට අදාළ කාර්යසාධනය ........................................ 25

විගණනය කල මූල්‍ය ප්‍රකාශ 2011 වර්ෂය ........................................ 26
විගණකාධිපතිගේ වාර්තාව 2011 වර්ෂය ........................................ 30
විගණකාධිපතිගේ වාර්තාව 2011 වර්ෂය කෙරෙහි UCSC හි අදහස් දැක්වීම ........................................ 36

දැක්ම සහ මෙහෙයුම

**දැක්ම පිළිබඳ ප්‍රකාශය**

නව දැනුම නිර්මාණය කිරීම, නිශ්චයාත්මක විමසුම් සංස්කෘතියක් තහවුරු කිරීම සහ ජාතියට ඇති සේවය සහ කැපවීමේ උද්යෝගය රැක ගැනීම.

**මෙහෙවර පිළිබඳ ප්‍රකාශය**

ජාතික සංවර්ධනයට උරදෙමින්, ඉහළ ආචාර ධර්ම සම්මතයන් සහ සමාජ වගකිවයුතු භාවය සහිත, නිර්මාණශීලී, විශ්ලේෂණාත්මක සහ ස්වාධීන චින්තනයෙන් පොහොසත්, ඉහළතම තාක්ෂණික නිපුණත්වයේ ස්ත්‍රීන් සහ පුරුෂයන් බිහි කිරීම.

අධ්‍යක්ෂක සමාලෝචනය

පරිගණක විද්‍යා, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ (ICT) උසස් අධ්‍යයන මධ්‍යස්ථානයක් ලෙස, මෙම ක්ෂේත්‍රයේ නවතම සංවර්ධනයන් සහිතව ICT කර්මාන්තයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි මට්ටම් වල ශිෂ්‍යයන් පුහුණු කිරීමට UCSC දිගටම කටයුතු කරන ලදී. UGC ඇතුළත් කර ගැනීම හරහා පිරිනමන ලද උපාධි වැඩසටහන් හතර සඳහා අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් 737 දෙනෙකු ලියාපදිංචි කරන ලදී. පරිබාහිරව විද්‍යා උපාධිධාරීන් 1160 දෙනෙකු විද්‍යාත්මක විෂය පථයන්ට අදාළව ICT භාවිතය පුහුණු කරන ලද අතර ශිෂ්‍යයන් 2365 දෙනෙකුට බාහිර ශිෂ්‍යයන් ලෙස BIT උපාධිය හැදෑරීමට අවස්ථාව සපයන ලදී. ශිෂ්‍යයන් 13 දෙනෙකු පර්යේෂණ උපාධි සඳහා ලියාපදිංචි වූ අතරතුර ශිෂයයන් 143 දෙනෙකු විද්‍යාපති උපාධි සඳහා ලියාපදිංචි කරන ලදී. පසුගිය වර්ෂවල ලියාපදිංචි වූ අයගෙන් 352 දෙනෙකු උපාධි අපේක්ෂක මට්ටමේ සහ 95 දෙනෙකු පශ්චාත් උපාධි මට්ටමේ උපාධි සම්පූර්ණ කරන ලදී.

වෙනත් පුහුණු කිරීමේ ආයතන වලින් වෙනකොට හඳුනා ගැනීම පිණිස පර්යේෂණ හරහා නව දැනුම නිර්මාණය කිරීම කෙරෙහි UCSC වැඩි අවධාරණයක් යොදන ලදී. එක් නව පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කරන අතරතුර කාර්ය මණ්ඩලය සම්මන්ත්‍රණ සහ සඟරා ලිපි 63 ක් ප්‍රකාශයට පත් කරන ලදී. තවද UCSC විදේශීය විශ්ව විද්‍යාලයකට ඇතුළුව, රාජ්‍ය අමාත්‍යාංශ සහ වෙනත් ආයතන වෙනුවෙන් උපදේශනාත්මක ව්‍යාපෘති කරගෙන යාමට දිගටම කටයුතු කරන ලදී. කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් CERT ප්‍රශ්න විචාරාත්මක තරඟය දිනා ගැනීමෙන් සහ NBQSA, e-Swabhimani යේදී පිළිගැනීමක් අත්කර ගැනීමෙන් සහ පශ්චාත් උපාධි පර්යේෂණ වලදී විශිෂ්ටත්වයට පත්වෙමින් සාර්ථකත්වයට පත්වීම දිගටම සිදුවන ලදී. ශිෂ්‍යයන්, පාසැල් දරුවන් ඉලක්ක කරගෙන ග්‍රාමීය ප්‍රදේශ වලට ඔවුන්ගේ IT අත දීමේ වැඩසටහන් සමග දිගටම නියැලෙන අතරතුර, සමාජයට ඔවුන්ගේ දායකත්වය ලෙස කාර්ය මණ්ඩලය බොහෝ බාහිර කමිටු, මණ්ඩල සහ වෘත්තීය සංවිධානයන්හි සම්බන්ධ වීම දිගටම කරගෙන යන ලදී.

අප පසුගිය වර්ෂයේ ශතවර්ෂ කාලක් වටිනා ජයග්‍රහණයන් අනුස්මරණය කරන ලදී. තවද අප අනාගතය සඳහා සමහර උන්නතිකාමී සැළසුම් ද පිහිටුවන ලදී. විශේෂයෙන්, එහි ව්‍යාප්ත කිරීමේ සැළසුම්, වෙනත් රටවල් තුලට එහි වාණිජමය සමපේක්ෂණය වීම සහ 21 වන ශතවර්ෂ මූලාරම්භය (HETC) සඳහා උසස් අධ්‍යාපනය තුලින් පුළුල් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සක්‍රීය දායකත්වය දියත් කිරීමට UCSC සූදානම්ය. HETC වෙතින් උපාධි අපේක්ෂක සංවර්ධන ප්‍රදානය සහ පශ්චාත් උපාධි සංවර්ධන ප්‍රදාන වෙනුවෙන් අසාර්ථක මිල ගණන් ඉදිරිපත් කිරීම සහ සවිස්තර ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ සැලසුම් පුරා යොදවන ලද පරිශ්‍රමයන් හඳුනා නොගැනීම නිසා සමහර කාර්ය මණ්ඩල පිරිස් අධෛර්යයට පත්වීම හේතුවෙන් මූලික සැලසුම්ගත ක්‍රියාකාරකම් අපගමනය වුවද, UCSC ප්‍රධාන විශ්ව විද්‍යාලයට වඩා අදායම් ඉපයුවා පමණක් නොව විශ්ව විද්‍යාල උපාධිධාරීන් අතර වඩාත් ඉහළ රැකියා නියුක්තික භාවයක් ද අත් කර ගන්නා ලදී.

මානව සම්පත් සංවර්ධන ප්‍රධාන අධීක්ෂණය කිරීම නොසලකා සිටියදීත්, දර්ශන විශාරද උපාධිය දක්වා

මෙහෙයවනු ලබන දර්ශනපති උපාධි ලියාපදිංචි කිරීම් හතරක් වෙනත් විශ්ව විද්‍යාල වෙතින් ආකර්ෂණය කර ගැනීමට අපට හැකි විය. ඊළඟ වර්ෂයේ දී ආරම්භ වීමට නියමිත බාහිර උපාධි වැඩසටහන් ශක්තිමත් කිරීමට සාර්ථක HETC මිල ඉදිරිපත් කිරීම් පමණක් යෙදවිය. 16000 කට වැඩි උපාධි අපේක්ෂකයන්ගේ ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය පුහුණු කිරීම සඳහා පූර්ව-හඳුන්වා දීමේ වැඩසටහන, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම සඳහා විශ්ව විද්‍යාල තේරීම් සහ වෙන් කිරීම් ක්‍රමය වැනි HETC අරමුදල් සපයන ලද වැඩසටහන් සහ වෙනත් බොහෝ අභියෝගාත්මක ව්‍යාපෘති UCSC භාරගත් අතර සාර්ථකව නිමකරන ලදී. එසේම UCSC ය පර්යේෂණ ව්‍යාපෘති සඳහා NRC ප්‍රදාන සහ NSF ප්‍රදාන තුන සුරකීමෙන් සාර්ථක විය.

UCSC හි බොහෝ කල් හිඟව පැවති භෞතික යටිතල පහසුකම් සංවර්ධනය වර්ෂය අවසාන වන්නට අරඹන ලදී. මෙය පසුගිය වර්ෂ පහ මුළුල්ලේ මුහුණදුන් උග්‍ර ඉඩකඩ ගැටළුවට අර්ධ වශයෙන් පිළිතුරු ලබා දෙනු ඇත. දර්ශන විශාරද උපාධිධාරීන් 18 දෙනෙකු සහිත රට තුළ අතිශයින් සුදුසුකම්ලත් පරිගණක කාර්ය මණ්ඩලය රඳවා ගැනීමට දිගටම කරගෙන යන අතරතුර එහි මානව සම්පත් හිඟයට අර්ධ වශයෙන් හෝ පිළිතුරු සැපයීමට UCSC ය එහි කාර්යාවාර්ය සංචිතය තවදුරටත් ශක්තිමත් කරන ලදී. අපගේ කාර්ය මණ්ඩල සමාජිකයකු උමියා විශ්ව විද්‍යාලයට සංචාරය කිරීමත් ඔවුන්ගේ කෙනෙකු සති හයක කාල පරිච්ඡේදයක් සඳහා UCSC වෙත සංචාරය කිරීමත් සමග ප්‍රථම වතාවට විදේශීය කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන දියත් කරන ලදී.

පවතින උපාධි වැඩසටහන් ජාත්‍යාන්තර ප්‍රමිතීන් සමග පෙළ ගැස්වීමට විෂයමාලා සංවර්ධනය කටයුතු දිගටම කරගෙන යන අතරතුර, ඊළඟ වර්ෂයේදී මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, ජෛව තොරතුරු විද්‍යාව පිළිබඳ නව උපාධි වැඩසටහන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

UCSC කෙරෙහි කෙටි බැල්මක්

| | | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| අධ්‍යාපනය (ඇතුළත් කරගත්/උපාධිය ලත්) | | | | |
| අභ්‍යයන්තර උපාධි අපේක්ෂකයන් | සියළු | 748 | 739 | 737 |
| | ඇතුල් වූ (240 %) | 228 (95%) | 236 (98%) | 238 (99%) |
| | පිට වූ (ඇතුල් වූ %) | 196 (86%) | 229 (97%) | 223 (94%) |
| විද්‍යා උපාධි අපේක්ෂකයන් | | 1006 | 1023 | 1160 |
| බාහිර ඩිප්ලෝමාව | සියළු | 3490 | 4281 | 4287 |
| | ඇතුල් වූ (සියළු %) | 2052 (59%) | 2514 (59%) | 2365 (55%) |
| | පිට වූ (සියළු %) | 429 (12%) | 361 (08%) | 576 (13%) |
| බාහිර උසස් ඩිප්ලෝමාව | සියළු | 1749 | 1863 | 2019 |
| | ඇතුල් වූ (සියළු %) | 737 (42%) | 688 (37%) | 863 (43%) |
| | පිට වූ (සියළු %) | 310 (18%) | 199 (11%) | 309 (15%) |
| බාහිර උපාධිය | සියළු | 1126 | 1188 | 1293 |
| | ඇතුල් වූ (සියළු %) | 417 (37%) | 403 (34%) | 442 (34%) |
| | පිට වූ (සියළු %) | 161 (15%) | 140 (12%) | 129 (10%) |
| පශ්චාත් උපාධිය | සියළු | 397 | 443 | 531 |
| | ඇතුල් වූ | 128 | 177 | 143 |
| | පිට වූ | 17 | 89 | 94 |
| ව්‍යාප්ති වැඩසටහන් | | 900 | 935 | 678 |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **පර්යේෂණ** | | | | |
| **පර්යේෂණ (දර්ශනපති/දර්ශන විශාරද)** | සියළු | 28/01 | 31/01 | 46 |
| | ඇතුල් වූ | 05 | 06 | 13 |
| | පිට වූ | 1 | - | 1 |
| පර්යේෂණ ව්‍යාපෘති | සියළු | 07 | 06 | 05 |
| | නව | 1 | 2 | 1 |
| ප්‍රකාශන | | 76 | 69 | 63 |
| **උපදේශනාත්මක ව්‍යාපෘති** | | | | |
| දේශීය | | 12 | 25 | 14 |
| විදේශීය | | 03 | 05 | 01 |
| **සමාජ වගකිව යුතු භාවය පිළිබඳ වැඩසටහන්** | | 10 | 18 | 10 |

| | | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| **පාලනය** | | | | |
| ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය | සියළු | 34 | 34 | 36 |
| | මහාචාර්ය (සියළු %) | - | 02 (06%) | 02 (06%) |
| | දර්ශණ විශාරද (සියළු %) | 17 (50%) | 18 (53%) | 18 (50%) |
| ස්ථිර අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | | 09 | 04 | 02 |
| තාවලික අධ්‍යයන කාර්ය මණ්ඩලය (උපදේශකයන්) | | 19 | 15 | 11 |
| ස්ථිර පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 26 | 35 | 32 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය (තාවකාලික සහ අභ්‍යාසලාභී ඇතුළුව) | | 84 | 72 | 37 |
| පර්යේෂණ/ව්‍යාපෘති කාර්ය මණ්ඩලය | | 36 | 18 | 14 |
| **මූල්‍ය** | | | | |
| වාර්ෂික පුනරාවර්තන වියදම (ශ්‍රී ලංකා රුපියල් මිලියන) | | 84 | 80 | 92 |
| භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) (ශ්‍රී ලංකා රුපියල් මිලියන)- සත්‍ය | | 69 | 65 | 83 |
| භාන්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධන) (ශ්‍රී ලංකා රුපියල් මිලියන)- සත්‍ය | | 4 | 5 | 16 |
| උපයන ලද අදායම | | 116 | 123 | 159 |
| UG සඳහා UCSC දායකත්වය (ශ්‍රී ලංකා රුපියල් මිලියන) (උපයන ලද %) | | 20 (17%) | 31 (25%) | 22 (14%) |
| UCSC අයවැය (ශ්‍රී ලංකා රුපියල් මිලියන) | | 186 | 171 | 205 |
| පර්යේෂණ/ව්‍යාපෘති (ශ්‍රී ලංකා රුපියල් මිලියන) | | 104 | 84 | 6.1 |
| සේවක පිරිවැය අනුපාතය (ශ්‍රී ලංකා රුපියල් '000s) වර්ෂයකට | | 414 | 457 | 578 |
| ශිෂ්‍ය පිරිවැය අනුපාතය (ශ්‍රී ලංකා රුපියල් '000s) – භාණ්ඩාගාරය | | 113 | 108 | 125 |
| **යටිතල පහසුකම්** | | | | |
| පුස්තකාල පොත් | | 9,600 | 9,999 | 10,214 |
| පරිගණක : කාර්ය මණ්ඩලය | | 1:1 | | |
| පරිගණක : ශිෂ්‍යයන් (සාමාන්‍ය ශිෂ්‍යයන්)<br>(විශේෂ ශිෂ්‍යයන්) | | 1:4<br>1:1 | | |
| ඉඩ භාවිතය (සේවකයකු) (වර්ග මීටර්) | | 5.98 | 6.99 | 9.42 |
| ඉඩ භාවිතය (ශිෂ්‍යයකු) (වර්ග මීටර්) | | 1.87 | 1.89 | 1.90 |

පරිගණක විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය තුළින් උසස් අධ්‍යාපනය සැපයීම, නගා සිටුවීම සහ සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස අවසන් වරට 1995 අංක 1 දරණ (සංශෝධිත) පනත මගින් සංශෝධනය කළ පරිදි 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 24 A(1) වගන්තිය යටතේ කළ නියෝගයක් මගින්, කොළඹ විශ්වවිද්‍යාලයේම ආයතන දෙකක් වන පරිගණක තාක්ෂණය පිළිබඳ අධ්‍යයනායතනය (ICT) සහ පරිගණක විද්‍යා අධ්‍යායනාංශය (DCS) ඒකාබද්ධ කිරීමෙන් 2002 සැප්තැම්බර් 1 වන දින කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) පිහිටුවන ලදී. පනත ප්‍රකාරව එය උසස් අධ්‍යාපන ආයතනයකි. UCSC අඳා පනත 2002 නොවැම්බර් 15 දින ගැසට් කරන ලද අතර (GZT NO. 1262/32) ඩිජිටල් අපරාධ විද්‍යාව ඇතුළු කිරීමට 2011 ජූලි 22 වන දින සංශෝධනය කරන ලදී (GZT NO. 1715/32).

**කෙටි ඉතිහාසයක්**

පරිගණකකරණය පිළිබඳ ඉගැන්වීම කොළඹ විශ්ව විද්‍යාලය තුළ ප්‍රථම වරට ආරම්භ කළේ 1967 තරම් ඈත අතීතයේදී සංඛ්‍යානනය ඒකකය ගණිත අධ්‍යානාංශයේ වෙනම ඒකකයක් ලෙස පිහිටුවීම මගිනි. පසුව මහාචාර්ය වී.කේ. සමරනායකගේ මූලික මගපෙන්වීම සහිතව, සංඛ්‍යානය ඒකකය සංඛ්‍යාන උපදේශාත්මක සහ දත්ත සැකසුම් සේවා මධ්‍යස්ථානයක් ලෙස ඉහළ නංවන ලදී. මෙය බොහෝ අනාගත සංවර්ධනයන් වලට මං සලසා තිබුණි. 1985 වනවිට, මෙම මධ්‍යස්ථානය සංඛ්‍යානය සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය (DSCS) දක්වා වර්ධනය වී තිබුණි. මෙම අධ්‍යානාංශයේ ප්‍රධාන කාර්යය වූයේ සංඛ්‍යානයෙහි සහ පරිගණක විද්‍යාවෙහි විශේෂ උපාධි පැවැත්වීමයි. කාණ්ඩයකින් හුදෙක් ශිෂ්‍යයන් 40 දෙනෙකු බිහි කරමින් DSCS පිරිනමන පරිගණක විද්‍යා විශේෂීකරණ වැඩසටහන, පරිගණක විද්‍යා ක්ෂේත්‍රය (CS) තුළ වැඩිවන ඉල්ලුමට කිසිසේත් ප්‍රමාණවත් නැත.

1997 දී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා ශිෂ්‍යයන් 50 ක කාණ්ඩයක් සෘජුවම පරිගණක විද්‍යා අධ්‍යයනය සඳහා බඳවා ගත්තද, කෙසේ නමුත්, මේ වනවිට, බොහෝ දෙනෙකු පරිගණක විද්‍යා ක්ෂේත්‍රය (CS) තුළ වැඩිවන ඉල්ලුමට සරිලන අයුරින් DSCS හි පරිගණක විද්‍යා උපඅංශය වෙනම අධ්‍යානාංශයක් ලෙස පුළුල් කිරීමට අවශ්‍ය බව අවබෝධ කරගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2001 වර්ෂයේදී, DSCS නම් වශයෙන් පරිගණක විද්‍යා අධ්‍යානාංශය සහ සංඛ්‍යාන අධ්‍යනාංශය ලෙස වෙන් කරන ලදී.

පරිගණක විද්‍යා අධ්‍යයනාංශය පීය්යක සීමාකාරි මූලික ව්‍යුහය තුළ ක්‍රියාත්මක වීමේ ස්වකීය සීමාවන් හඳුනාගත් අතර ඒ සමගම එය අනාගත වර්ධන විභවතාවයන් උකහා ගැනීම සඳහා ශක්තිමත් කර්මාන්ත සබඳතාවයක් තිබීමේ වැදගත්කම අවබෝධ කර ගත්තේය. විශ්ව විද්‍යාලය කර්මාන්ත අභිමුඛ පරිගණක තාක්ෂණ ආයතනය (ICT) සහ න්‍යායිකව වඩාත් නැඹුරු වූ කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක විද්‍යා අධ්‍යයනාංශය අතර උපායමාර්ගික ඒකාබද්ධයක වැදගත්කම හඳුනා ගන්නා ලදී.

ICT ට කර්මාන්ත සමග ද ඒ සමගම විදේශීය පරිත්‍යාග දෙන නියෝජිතායතන සමග ද ශක්තිමත් සබඳතාවයක් පැවතිණි. ඒසේම ICT ජපාන ජාත්‍යාන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA), ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (Sida) වෙතින් විශාල සම්පත් ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා පහසුවක් ඇති කරමින් ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම් වලදී වැඩි ස්වාධිපත්‍යයක් භුක්ති විඳින ලදී.

මෙම ඒකාබද්ධය 2002 සැප්තැම්බර් 01 වන දින කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට (UCSC) උත්පත්තිය ලබා දුන්නේය. ඔහුගේ ප්‍රගාමී චින්තනයෙන් UCSC හි අනුයාත ප්‍රයත්නයන් කිහිපයකින් සාර්ථකත්වය අත්කර ගැනීමට මාර්ගය පාදාදුන් මහාචාර්ය වී.කේ. සමරනායක UCSC හි සමාරම්භක අධ්‍යක්ෂක බවට විය. මේ සියල්ල හරහා, UCSC ට ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පද්ධතිය තුල ICT හි විශිෂ්ඨතම මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපනය වීමට හැකිවිය.

UCSC හි සංවිධානය

අධ්‍යයනාංශ තුන සහ මධ්‍යස්ථාන හය ප්‍රවර්තන වර්ෂය සඳහා ද ඔවුන්ගේ ක්‍රියාකාරී වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම දිගටම කරගෙන යන ලදී.

UCSC හි අධ්‍යයනාංශ

උපාධි අපේක්ෂක අධ්‍යයන වැඩසටහන සඳහා, රාජ්‍ය අරමුදල් UGC හරහා UCSC විසින් ලබා ගනී. ලද මුදල් වර්ෂය සඳහා සැලසුම්ගත ක්‍රියාකාරකම් කරගෙන යාමට ප්‍රමාණවත් නොවුන අතර මේ නිසා ඇතැම් උපයාගත් අදායම් උපාධි අපේක්ෂක අධ්‍යයන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලදී. UCSC සතුව අධ්‍යයනාංශ තුනක් ඇති අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ විශේෂීකරණය සහ ඉගැන්වීමේ විශේෂඥතාවය පදනම් කොටගෙන මෙම අධ්‍යයනාංශ වෙත වෙන් කරන ලදී. පිලිවෙළින් උපාධි අපේක්ෂක, පශ්චාත් සහ බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන් ඒවාට හිමි වැඩසටහන් පිරිනමනු ලබන්නේ නොමැති නිසා අධ්‍යයනාංශ ප්‍රධානීන් තුන් දෙනෙකු පත් කරන ලදී. අධ්‍යයනාංශ තුන වන්නේ,

1. ගණනය කිරීමේ සහ බුද්ධිමත් පද්ධති (CIS);
2. සන්නිවේදන සහ මාධ්‍ය තාක්ෂණ (CMT);
3. තොරතුරු පද්ධති ඉංජිනේරු විද්‍යාව (ISE).

UCSC හි මධ්‍යස්ථාන

UCSC බොහෝ ද්විතියික ක්‍රියාකාරකම් ද ඉදිරිපත් කරයි. මෙම ක්‍රියාකරකම් වෙන්වූ මධ්‍යස්ථාන හයක් යටතේ සංවිධානය කරනු ලබයි. එක් එක් මධ්‍යස්ථානය සතුව මධ්‍යස්ථානයේ දෛනික රාජකාරි කටයුතු හසුරුවන සම්බන්ධීකාරකයකු සිටී. මධ්‍යස්ථාන හය පහත පරිදි ය:

1. උසස් ඩිජිටල් බහුමාධ්‍ය මධ්‍යස්ථානය (ADMTC);
2. ගණනය කිරීමේ සේවා මධ්‍යස්ථානය (CSC);
3. බාහිර උපාධි මධ්‍යස්ථානය (EDC);
4. e-ඉගැනීමේ මධ්‍යස්ථානය (e LC);
5. වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC);
6. ඩිජිටල් අපරාධ සඳහා මධ්‍යස්ථානය (CDF).

පාලනය

---

සංයුක්ත සැලැස්මහි සටහන් කර ඇති පරිදි, UCSC ක්‍රියාකරකම් හි මුඛ්‍ය ක්ෂේත්‍ර වන්නේ *අධ්‍යාපනය, පර්යේෂණ, උපදේශනය සහ සමාජ වගකිව යුතු භාවයයි.* මෙවායින්, UCSC ආයතනය ඉතිරි ICT අධ්‍යාපන අංශය වෙතින් වෙන්කොට තබන සහ පිළිවෙළින් අනෙක් අධාරක තුනට දායක වන මධ්‍යයම අධාරකය ලෙස පර්යේෂණය හඳුනාගෙන තිබේ. මෙම අධාරක වලට ප්‍රධාන මූලාශ්‍ර දෙකක් මගින් සහාය දක්වයි; මානව සහ භෞතික යටිතල පහසුකම්/සම්පත් සහ පරිපාලන/මූල්‍ය සේවා. ඊට අමතරව, මෙම සියළුම පැති යහ පාලනයේ 'පියසක්' මගින් ප්‍රශස්ථ සඵලත්වය සඳහා එක්ව තබාගෙන අධීක්ෂණය කරයි.

කළමනාකරණය

UCSC හි කළමනාකරණය අංශාධිපතීන්ගේ සහ මධ්‍යස්ථාන සම්බන්ධීකාරකයන්ගේ සහයෝගය ඇතිව UCSC හි නිලධාරීන් විසින් මෙහෙයවයි. UCSC හි සියළුම ව්‍යවස්ථාපිත සහ තේරීම් කමිටුවල රැස්වීම් අධ්‍යක්ෂක විසින් හොබවයි.

UCSC හි නිලධාරීන්

**අධ්‍යක්ෂක:** මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක; නියෝජ්‍ය අධ්‍යක්ෂක: අචාර්ය ඩී.එන්. රණසිංහ (සැප්තැම්බර් වනතුරු); මහාචාර්ය එන්.ඩී. කොඩිකාර (ඔක්තෝබර් සිට);

UCSC හි අධ්‍යයනාංශ ප්‍රධානීන්

CIS: ජී.පී. සෙනෙවිරත්න මහතා; CMT: ජී.කේ.ඒ. ඩයස්; ISE: මහාචාර්ය එන්.ඩී. කොඩිකාර (ඔක්තෝබර්

වනතුරු); ආචාර්ය ඩී.ඩී. කරුණාරත්න (නොවැම්බර් දක්වා);

UCSC හි මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන්

**ADMTC: එස්.ටී. නන්දසාර මහතා;** CSC: අචාර්ය ඒ.ටී. ධර්මරත්න; එල්.පී. ජයසිංහ මහතා; **EDC: එස්.පී. ආරියරත්න මහත්මිය; eLC:** අචාර්ය ඩී.ඩී. කරුණාරත්න *(නොවැම්බර් වනතුරු);* අචාර්ය කේ.පී. හේවාගමගේ (දෙසැම්බර් සිට); **PDC:** අචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක; **CDF:** කේ.එස්. ගුණතිලක මහතා *(සැප්තැම්බර් සිට).*

*අධිකාරීන්*

අධ්‍යයනායතනයේ අධිකාරීන් වන්නේ කළමනාකරණ මණ්ඩලය; අධ්‍යයන සම්මේලය; අධ්‍යයන මණ්ඩල; අධ්‍යයන අධ්‍යයනාංශ සහ මධ්‍යස්ථාන.

**කළමනාකරණ මණ්ඩලය**

වර්ෂය අතරතුර කළමනාකරණ මණ්ඩලයේ මාසික රැස්වීම් 12 ක් සහ විශේෂ රැස්වීම් 04 පවත්වන ලදී. කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත දක්වා ඇත.

අධ්‍යයක්ෂක (සභාපති); නියෝජ්‍ය අධ්‍යක්ෂක; අධ්‍යයනාංශ ප්‍රධානීන් (CIS/CMT/ISE); **නාමිකයා/ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය:** පියසේන රණේපුර මහතා; නාමිකයා/**මුදල් අමාත්‍යාංශය:** ආර්. උඩුවාවල මහතා; පීඨාධිපති, විද්‍යා පීඨය: කේ.ආර්.ආර්. මහානාම (වැඩබලන ජන-පෙබ); ටී.ආර්. ආරියරත්න; උපදේශක මණ්ඩල නාමිකයන්, UOC: සී.මාලියද්ද මහතා; මහින්ද රාජපක්ෂ මහතා (ජූලි වනතුරු), අසෝක පතිරගේ මහතා (සැප්තැම්බර් සිට); **පාලක සභාවේ නාමිකයන්, UOC:** කේ.එච්. මහාචාර්ය තෙන්නකෝන්; **UGC හි නාමිකයන්: එස්. මුදලිගේ මහතා;** දේශමාන්‍යය එම්.ඩී.ඩී. පීරිස් මහතා; **IT කර්මාන්තයේ නියෝජිතයන්: ජයන්ත ද සිල්වා මහතා;** මනෝ සේකරම් මහතා; **අධ්‍යයන සම්මේලන නාමිකයන්, UCSC: අචාර්ය එච්.එල්. ප්‍රේමරත්න** (ඔක්තෝබර් වනතුරු); ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරාළ (ඔක්තෝබර් වනතුරු); අචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණාතිලක (ඔක්තෝබර් වනතුරු); ආචාර්ය ඩී.එන්. රණසිංහ (නොවැම්බර් සිට), ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න (නොවැම්බර් සිට), ආචාර්ය එම්.සී. ජයවර්ධන (නොවැම්බර් සිට); හිටපු අධ්‍යඅක්ෂක (ආරාධිත): ආචාර්ය ඒ.ආර්. වීරසිංහ.

කළමනාකරණ මණ්ඩලයට උප-කමිටු දෙක වන, මූල්‍ය සහ කළමනාකරණ කමිටුව සහ විගණන කමිටුව සහාය විය. වර්ෂය අතරතුර රැස්වීම් 03 බැගින් කමිටු දෙකම පැවැත් විය. කමිටු දෙකේ සංයුතිය පහත දැක්වේ.

**මූල්‍ය සහ කළමනාකරණ කමිටුව**

**අධ්‍යක්ෂක *(සභාපති);* නියෝජ්‍ය අධ්‍යක්ෂක;** පියසේන රණේපුර මහතා; ආර්. උඩුවාවල මහතා; මහාචාර්ය ටී.ආර්. ආරියරත්න; දේශමාන්‍ය එම්.ඩී.ඩී. පීරිස් මහතා; ජයන්ත ද සිල්වා මහතා.

**විගණන කමිටුව**

සුජීව මුදලිගේ මහතා (සභාපති); නියෝජ්‍ය අධ්‍යක්ෂක; ජයන්ත ද සිල්වා මහතා; සී. මාලියද්ද මහතා.

**අධ්‍යයන සම්මේලය**

වර්ෂය අතරතුර අධ්‍යයන සම්මේලයේ රැස්වීම් 11ක් පවත්වන ලදී. අධ්‍යයන සම්මේලයේ සංයුතිය පහත දන්වා ඇත.

**අධ්‍යක්ෂක; නියෝජ්‍ය අධ්‍යක්ෂක;** අධ්‍යයනාංශ **ප්‍රධානීන්** (CIS/ CMT/ISE); මධ්‍යස්ථාන **සම්බන්ධීකාරකවරුන්** (ADMTC/CSC/ EDC/eLC/PDC); **නාමිකයන් (විද්‍යා අධ්‍යයනාංශය): මහාචාර්ය ආර්.ඩී. විජේසේකර; නියෝජිතයන්/IT කර්මාන්තය:** ආචාර්ය ආර්.ඒ.සී. රණසිංහ; ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයන් (UCSC); **ඉගැන්වීමේ සාමාජිකයන් දෙදෙනෙකි:** එල්.පී. ජයසිංහ මහතා; ඩබ්.ඩී.ජී.එම්. වතුගල මහතා (ඔක්තෝබර් වනතුරු); ඩබ්.එම්.ආර්. වීරසූරිය මහතා (නොවැම්බර් සිට).

**අධ්‍යයන පාලක මණ්ඩලය**

අධ්‍යයන පාලක මණ්ඩල තුනක් තිබේ, නම් වශයෙන් IUD, RHD and EEP. ඔවුන් අභ්‍යන්තර උපාධි අපේක්ෂක උපාධි (IUD), පර්යේෂණ සහ උසස් උපාධි (RHD) සහ අභ්‍යයන්තර සහ ව්‍යාප්ති වැඩසටහන්

(EEP) වෙත කේන්ද්‍රගත වී ඇත. මණ්ඩල තුනට වර්ෂය තුළ පිළිවෙලින් රැස්වීම් 9, 10 සහ 11 ක් තිබුණි.

අධ්‍යාපනය

වැඩසටහන් සහ ශිෂ්‍යයන්

UCSC විවිධ මට්ටම් වලදී පුළුල් පරාසයක වැඩසටහනක් පිරිනමයි. 1 වන වගුව සම්බන්ධිත ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සමගින් UCSC විසින් පවත්වන පාඨමාලා (වැඩසටහන්) හඳුන්වාදෙයි.

1 වන වගුව: පිරිනමන පාඨමාලා වර්ග

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි වැඩසටහන් | 1,125 | 48 | 62 |
| පර්යේෂණ සහ වෙනත් ව්‍යාපෘති | 41 | 13 | 10 |
| ව්‍යාප්ති පාඨමාලා | 678 | 07 | 55 |
| බාහිර උපාධිය | 5,562 | 41 | 11 |
| මාර්ගගත | 13,841 | 3 | 15 |
| වෙනත් – විද්‍යා පීඨය | 1,160 | 19 | 2 |

උපාධි අපේක්ෂක අධ්‍යාපනය

උපාධි අපේක්ෂකයින් සඳහා පරිගණක විද්‍යා අධ්‍යාපනය විද්‍යා පීඨයේ කොටසක් වශයෙන් 1967 දී මුලින්ම හඳුන්වා දෙන ලදී. UCSC විසින් මෙම අවස්ථාව විද්‍යා පීඨයේ සිසුන් 1160 කට ලබාදීම ඉදිරියට කරගෙන යන ලදී. පරිගණක විද්‍යාව උපාධියක් වශයෙන් ලබාදීම 1990 දී ආරම්භ කරන ලදී. උපාධි අපේක්ෂකයෝ 1897 ක් UCSC හි පුහුණුව ලබති. දැනට UCSC විසින් සිසුන් 486 කට පරිගණක විද්‍යා (CS) උපාධිය ද සිසුන් 251 කට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) උපාධියද පිරිනමයි.

අභ්‍යන්තර උපාධි

UCSC මගින් පරිගණක විද්‍යාව (CS) හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) යන ක්ෂේත්‍රයේ අභ්‍යන්තර උපාධි වැඩසටහන් දෙකක් පිරිනැමීම අඛණ්ඩව සිදු කරයි. මෙකී උපාධි වැඩසටහන් දෙක සකස් කර ඇත්තේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විවිධ වෙළඳ අවශ්‍යතා ඉලක්ක කරගෙන වන අතර වසර තුන සහ වසර හතර වශයෙන් විකල්ප දෙකක් තිබේ. CS උපාධිය සඳහා උ/පෙ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් සිසුන් ඇතුළත් කරගන්නේ ICT උපාධිය ඕනෑම විෂය ධාරාවකට විවෘතව පවතින විටදීය.

*පරිගණක විද්‍යාවේදී* (BCSc) සහ *පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී* (BSc(CS)) යන උපාධි සකස් කර ඇත්තේ ලොව පුරා පවතින පරිගණක විද්‍යා වෘත්තිකයන් සඳහා ඇති ඉහළ ඉල්ලුම සඳහායි. BCSc උපාධි වැඩසටහන වසර තුනක වැඩසටහනක් වන අතර BSc(CS) වසර හතරක වැඩසටහනකි.

ICT වැඩසටහන ව්‍යාපාරික අවශ්‍යතා සහ තාක්ෂණික විසඳුම් අතර වන හිඩැස පිරවීමට නව ආකාරයේ තොරතුරු පද්ධති (IS) වෘත්තිකයන් බිහි කිරීමට නිර්මාණය කර ඇත. මෙම උපාධි වැඩසටහන මෙම නව ICT වෘත්තිකයන් බිහි කිරීමට නිර්මාණය කර ඇත. මෙම වැඩසටහනේ විෂය නිර්දේශය සන්නිවේදනය හා කණ්ඩායම් ක්‍රියා වැනි මෘදු කුසලතාවන්හි ඇති වැදගත්කම හුවා දක්වයි. මෙම තුන් අවුරුදු උපාධිය *තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී* (BICT) ලෙස නම් කර ඇති අතර සිව් අවුරුදු උපාධිය *තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී* (BSc (ICT)) ලෙස නම් කර ඇත.

උපාධි වැඩසටහන් වලට ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීමට අපගේ උපාධි වැඩසටහන් ජාත්‍යන්තරව පිළිගත් ACM/ IEEE මාර්ගෝපදේශයන්ට අනුකූලව පෙළ ගැස්වීමට අවශ්‍ය විය. මෙම ක්‍රියාවළිය ඇරඹීමට විෂයමාලා නිර්මාණය පිළිබඳ වැඩමුළු ගණනාවක් පැවැත් විය. මෙම ක්‍රියාවළියේදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) උපාධි වැඩසටහන ACM/IEEE හි තොරතුරු පද්ධති විෂය ධාරාව සමග පෙළ

ගැස්වීමට අවශ්‍ය බව හඳුනාගන්නා ලදී. මේ අනුව ICT උපාධිය තොරතුරු පද්ධති උපාධියට වෙනස් කිරීමට UGC වෙතින් අනුමැතිය ලබා ගන්නා ලදී. බොහෝ උපාධිධාරීන් මෘදුකාංග ඉංජිනේරුවරුන් බවට පත්වන නිසා මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව හඳුන්වා දීමට අවශ්‍ය විය. පරිගණක විද්‍යා ඇතුලත් කර ගැනීම් සඳහා මෘදුකාංග ඉංජිනේරු විෂය ධාරාව ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාල අනුමැතිය ද ලබා ගන්නා ලදී. ඒ අනුව UCSC ය පරිගණක කරණ උපාධි හතරක් පිරිනමනු ඇත, නාමිකය: පරිගණක විද්‍යාව, මෘදුකාංග ඉංජිනේරුකරණය, තොරතුරු පද්ධති සහ තොරතුරු තාක්ෂණ උපාධි. ඒ අතරින් මෘදුකාංග ඉංජිනේරුකරණය සහ තොරතුරු පද්ධති 2012/13 ඇතුලත් කර ගැනීම් වලින් විශ්ව විද්‍යාල වලට ඇතුළු වන අයවලුන් සඳහා නව උපාධි වැඩසටහන වනු ඇත.

The CS උපාධි වැඩසටහන පවතින තුන් අවුරුදු ඉවත්වීම සහ 3+1 (4 වර්ෂ) උපාධි වෙනුවට 2+1 (3 වර්ෂ) and 2+2 (4 වර්ෂ) උපාධි පිරිනැමීමට ප්‍රතිනිර්මාණය කරන ලදී. නව වැඩසටහනේ පවතින වර්ෂ 3 සහ 4 CS ඉවත්වීමට අමතරව වර්ෂ 4 ක මෘදුකාංග ඉංජිනේරුකරණ (SE) විෂය ධාරාව අන්තර්ගත වනු ඇත.

UGC වෙතින් අනුමැතිය ලබාගත් ICT සිට IS දක්වා නම් වෙනස විෂය ධාරා සංශෝධනයට ප්‍රතිඵලය විය. නව 3 වර්ෂ උපාධිය තොරතුරු පද්ධතිවේදී (BIS) සහ 4 වර්ෂ උපාධිය තොරතුරු පද්ධති ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ISE) වශයෙන් අමතනු ඇත. 2012 ඇතුලත් කර ගැනීම් වලින් නව විෂයමාලාව බලපැවැත්වීමට නියමිතය.

**ඇතුළත් කර ගැනීම**

UCSC විසින් CS උපාධි වැඩසටහන සඳහා 160 දෙනෙකුගේ ශිෂ්‍ය කණ්ඩායමක්ද ICT උපාධි වැඩසටහන සඳහා 78 දෙනෙකුගේ ශිෂ්‍ය කණ්ඩායමක්ද ලෙස UCSC හි ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 737 ක් වන ලෙස ඇතුළත් කරගන්නා ලදී (වගුව 2). ICT උපාධි වැඩසටහන සඳහා තෝරා ගැනීමට යාපනය, වවුනියාව, අනුරාධපුරය, මහනුවර හා කොළඹ දී පවත්වන ලද අභියෝගයතා පරීක්ෂණයක් ඇතුළත් විය. විභාගයට පෙනී සිටි 1678 න් 740ක් ICT උපාධිය සඳහා සුදුසුකම් ලැබූ අතර 269 ක් පරීක්ෂණයට පෙනී නොසිටියහ. UCSC හි ICT උපාධි වැඩසටහන සඳහා ඇතුළත්වීමට නව අ.පො.ස. (උ/පෙළ) ICT විෂයද සුදුසුකමක් වන බවට සලකන ලදී. 2011 ඇතුළත් කරගැනීමේ සමාරම්භක උත්සවය ඔක්තෝබර් 24 දා පවත්වන ලදී. CS සහ ICT උපාධි ලියාපදිංචි කිරීම් අදියර 8 හා 5 ලෙස ශිෂ්‍ය මාරු ප්‍රතිපත්තිය හේතුවෙන් පවත්වන ලදී. CS උපාධිය සඳහා 190 දෙනෙකු ද ICT උපාධිය සඳහා 97 දෙනෙකු ද ලියාපදිංචි වූ අතර CS හි 32 දෙනෙක්ද ICT හි 20 දෙනෙක්ද මාරු වී ගියහ. CS සඳහා නැවත ලියාපදිංචි කිරීම් 2 ක්ද ICT සඳහා නැවත ලියාපදිංචි කිරීම් 1ක් ද විය. UCSC හි සහාය ඇතිව පැවැත් වූ අමාත්‍යාංශයේ පූර්ව සමාරම්භක වැඩසටහන හේතුවෙන් මෙම ඇතුළත් කරගැනීමට වෙනම සමාරම්භක වැඩසටහනක් නොපවත්වන ලදී. කොළඹ විශ්ව විද්‍යාලය නව බඳවා ගැනීම සඳහා සැප්තැම්බර් 4 දා ශ්‍රමදානයක් සංවිධානය කරන ලදී. ඔක්තෝබර් 24 පැවති සමාරම්භක උළෙල අවසානවත්ම නව ඇතුළත් කරගැනීමේ දේශන ආරම්භ විය.

2 වගුව: අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන්

| පාඨමාලාව | ඇතුලත් කර ගැනීම් 2011 | 1 වන වර්ෂයේ ශිෂ්‍යයන් | 2 වන වර්ෂයේ ශිෂ්‍යයන් | 3 වන වර්ෂයේ ශිෂ්‍යයන් | 4 වන වර්ෂයේ ශිෂ්‍යයන් | එකතුව | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යාවේදී උපාධිය | 160 | 160 | 148 | 138 | 0 | 446 | 106 |
| පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය | 40 | 0 | 0 | 0 | 40 | 40 | 40 |
| පරිගණක තාක්ෂණ තොරතුරු විද්‍යාවේදී උපාධිය | 80 | 78 | 77 | 76 | 0 | 231 | 57 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක තාක්ෂණ තොරතුරු විද්‍යා විද්‍යාවේදී උපාධිය | 20 | 0 | 0 | 0 | 20 | 20 | 20 |
| UCSC හි උපාධි අපේක්ෂකයන් | 300 | 238 | 225 | 214 | 60 | 737 | 223 |
| විද්‍යා විද්‍යාවේදී උපාධි පීඨය | - | 439 | 355 | 326 | 40 | 1160 | - |
| අභ්‍යයන්තර උපාධි අපේක්ෂකයන් | 300 | 677 | 580 | 540 | 100 | 1897 | 223 |

**සියළු පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි**

**බාහිර කාර්ය මණ්ඩලය**

අභ්‍යන්තර උපාධි අපේක්ෂක පාඨමාලා ප්‍රදානයේ දී සියලු අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය සහභාගි විය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධි පාඨමාලාව තුළ බාහිර සහාය අවශ්‍ය පාඨමාලා බොහොමයක් අඩංගුය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධි පාඨමාලාවේ පාඨමාලා 11 ක් පැවැත්වීමට බාහිර කථිකාචාර්යවරුන් ලෙස පුද්ගලයින් 15 ක් ආරාධනා ලැබිය.

**කාර්මික පත් කිරීම**

වෘත්තීය සංවර්ධන ආයතනය (PDC), තොරතුරු තාක්ෂණ කර්මාන්තය සමග සමීප සම්බන්ධතාව සහ උපාධි අපේක්ෂකයන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යයන වැඩසටහන්වල උන්නතිය කාර්මික සම්බන්ධය තුළින් නොකඩවා පවත්වාගෙන ගියේය. මෙම වසර තුළ වෘත්තීය සංවර්ධන ආයතනය (PDC) විසින් මාස 6 ක පුහුණුවට උපාධි අපේක්ෂකයින් 226 ක් සංවිධාන 66 කට පත් කර ඇත. උපාධිධාරියෙක් වූ පසු ක්‍රියා කිරීමට වන වෘත්තීමය භූමිකාව පිළිබඳ උපාධි අපේක්ෂකයින් දැනුවත් කිරීම සඳහා ස්වේච්ඡාවෙන් සහභාගි වන සමාගම් සඳහා ආරාධිත දේශන මාලාවක් PDC විසින් සංවිධානය කරන ලදී. එම දේශන තුළින් උපාධි අපේක්ෂකයින් හට මනා සමාරම්භක වැඩසටහනක් සහ ආධුනික පත්වීම සඳහා පෙර සූදානමක් සැපයීය. ආධුනික පත්වීමේ කාලය තුළ ලබා ගත යුතු අරමුණු හා කුසලතා පිළිබඳව ඔවුන් වෙත මනාව සන්නිවේදනය කෙරිණි.

කාර්මික පුහුණුවට අමතරව PDC විසින් 4 වන වසර උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ කාර්මික වෘත්තියට 'පා නැගීමට' අත්‍යවශ්‍ය මෘදු කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව මෘදු කුසලතා සංවර්ධන වැඩසටහනක් සංවිධානය කරන ලදී. ටෝස්ට්මාස්ටර්ස් ඉන්ටර්නැෂනල් (Toastmasters International) විසින් සාර්ථක උපාධි අපේක්ෂකයන්ට සහතිකයක් ප්‍රදානය කරනු ලබයි.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම්**

ප්‍රධාන වශයෙන් සංස්කෘතික, චාරිත්‍රමය සහ විනෝද ක්‍රියාකාරකම් ප්‍රවර්ධනයට ශිෂ්‍ය සංගමය ඔස්සේ ශිෂ්‍ය ක්‍රියාකාරකම් සිදු කෙරේ. එම ක්‍රියාකාරකම් අතර ශ්‍රමදාන වැඩසටහන, පිරිත් මංගල්‍යය, ක්‍රීඩා දිනය, පැදුරු සාජ්ජය, ලේ දන් දීමේ වැඩසටහනක්, වෙසක් බැති ගී, සමුගැනීමේ උත්සවය, වානිවිලා මංගල්‍යය සහ නත්තල් කැරොල් වේ. UCSC ශිෂ්‍යයන් නොයෙක් වැඩමුළු UCSC තුළ සහ GCE (O/L) සහ GCE (A/L) ICT ශිෂ්‍යයන් හා ගුරුවරුන්ගේ සහායට පාසල් තුළ පවත්වයි.

**ශිෂ්‍ය ජයග්‍රහණ**

ශ්‍රී ලංකා CERT මගින් සංවිධානය කළ තොරතුරු සුරක්ෂිතතා පැණ විසඳුම් තරඟය UCSC ශිෂ්‍යයන් ජයග්‍රහණය කළේය. එච්. පී. ඩී. ජයතිලක, එන්. කුලරත්න සහ ඊ. ඒ. ඩී. අයි. ඇඹුල්දෙනිය ගේ "Business Cloud for SMES" ව්‍යාපෘතියට විශේෂ ඇගයීමක් NBQSA හි දී ලැබුණි. කණ්ඩායම් 13 ක් IEEEXtreone 5.0 තරඟයට සහභාගි වූ අතර විශිෂ්ටතමයන් අතුරින් ලෝකයේ 216 වන ස්ථානයට UCSC පත් විය. එසේම ශිෂ්‍යයන් Google Summer Code, Imagine Cup සහ Motorola Enterprise Mobility Software Development තරඟ වලට සහභාගි වූහ.

**ක්‍රීඩා**

2011 සැප්තැම්බර් 14 සිට 18 දක්වා ඉන්දියාවේ රාජස්තාන්, පිලානි හි පැවති බර්ලා තාක්ෂණ සහ විද්‍යා ආයතනය (BITS) හිදී පැවති විවෘත ක්‍රීඩා උළෙලට (BOSM) මලල ක්‍රීඩා (පිරිමි) අංශයෙන් එස්.කේ

වෙගපිටිය (2009/CS/169); ඊ. එම්. එස්. සී. බී. ඒකනායක(2009/CS/033); ඩබ්. එම්. එච්. පී. වීරසිංහ (2009/CS/161) යන සිසුන් තිදෙනා සහභාගි වූහ. වෙගපිටිය හෙල්ල විසි කිරීමේ රන් පදක්කමද, වීරසිංහ දුර පැනීමේ රන් පදක්කමද සහ ඒකනායක මීටර් 200 ලෝකඩ පදක්කමද ජයග්‍රහණය කළහ. BOSM හි හොකී (පිරිමි) තරඟයට පී. ජී. සී. දංගල්ල (2008/ICT/007) සහ කැරම් (පිරිමි) තරඟයට එච්. ඩී. එස්. පී. ආරියරත්න සහභාගි වූහ. චීනයේ ෂෙන්සෙන්හි පැවති XXVI වන ලෝක විශ්ව විද්‍යාලයීයය තරඟයට එස්. ඩී. ජේ. එම්. එන්. අර්සකුලරත්න (2008/CS/141) සහභාගි වූ අතර මැලේසියාවේ ජාත්‍යන්තර අන්තර්-වාසිටි ක්‍රිකට් තරඟාවලිය සඳහා පී. ඒ. ජේ. මුනිදාස (2009/CS/174) සහභාගි විය.

## උපාධි ප්‍රදානය


උපාධි පාඨමාලා 4 ක ශිෂ්‍යයන් 202 ක් සඳහා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලැබීය. ICT උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඕනෑම උ/පෙ විෂය ධාරාවක් යටතේ තෝරා ගන්නා ලදී. මෙම සිසුන් සඳහා විෂය ධාරාවට අදාළව කාර්ය සාධනය ද 3 වන වගුවෙහි පෙන්වයි.

තොරතුරු තාක්ෂණ කර්මාන්තය තුළ පිළිගත් ව්‍යාපාර ආයතන වාසි සහගත ගිවිසුම් මත තුන්වන වසර උපාධි පාඨමාලාව හදාරන බොහෝ සිසුන්ව ඔවුන්ගේ කාර්මික ස්ථානගත කිරීම අවසන් වීමටත් පෙර බඳවා ගැනීම නිරීක්ෂණය කරන ලදී. උපාධිය අවසන් කොට මාස 6 කට පසුව පවත්වනු ලබන උපාධි ප්‍රදානෝත්සවය අතරතුර සමීක්ෂණයක් සිදු කරන ලදී. සමීක්ෂණයට සහභාගි වූ උපාධිධාරීන් 158 දෙනෙකාගෙන් 133 දෙනෙක් ඒ වනවිටත් රැකියා සොයාගෙන තිබිණි (84%). කාන්තා රැකියා නියුක්තිකයන්ගේ ප්‍රතිශතය (92%) පිරිමි රැකියා නියුක්තිකයන්ගේ (87%) ප්‍රතිශතයට වඩා යන්තම් වැඩිය. 4 වන වසර උපාධි සිසුන්ගේ රැකියා නියුක්තිය (97%) 3 වන වසර උපාධියට (86%) ට වඩා වැඩිය. සියලුම පළමු පෙළ පන්ති සාමාර්ථ සිසුන් හා දෙවන පෙළ ඉහළ සාමාර්ථ සිසුන් රැකියා නියුක්තිකයන් වූයේ සාමාන්‍ය සිසුන් 79% ක් පමණක් රැකියා නියුක්තිකයන් වන විටදීය. සියලුම රැකියා විරහිත පුද්ගලයින් රු. 20,000 හෝ ඊට ඉහළ ඉහළ වැටුපක් අපේක්ෂා කරන අතර රැකියා නියුක්තිකයන්ගෙන් 6% ක් රු. 20,000 ට අඩු ඉපයීමක් සහිත විය. බොහෝ රැකියා නියුක්තිකයන් රු. 40,000 සිට 50,000 අතර උපයන අතර ශිෂ්‍යයන් 7 දෙනෙක් රු. 100,000 ට වඩා උපයයි. උපාධිධාරියෙකුගේ සාමාන්‍ය වැටුප රු. 50,000 - 60,000 අතර වේ. බොහෝ දෙනෙක් පෞද්ගලික අංශයේ රැකියාවල නියුක්ත වූහ (87%).

3 වගුව: UCSC උපාධිධාරීන්ගේ කාර්යසාධනය

| ඇතුළත් කර ගැනීම | පළමු | ඉහළ | පහළ | සමත් | එකතුව |
|---|---|---|---|---|---|
| BCSc | 1 | 4 | 14 | 74 | 93 |
| BICT | 4 | 7 | 10 | 29 | **50** |
| ගණිතය | 3 | 5 | 7 | 19 | 34 |
| ජීව විද්‍යාව | 0 | 0 | 3 | 4 | 07 |
| වාණිජ්‍යය | 1 | 2 | 2 | 5 | 10 |
| කලා | 0 | 0 | 0 | 6 | **06** |
| BSc CS | 10 | 12 | 16 | 3 | 41 |
| BSc ICT | 6 | 6 | 6 | 0 | **18** |
| ගණිතය | 4 | 5 | 5 | 0 | **14** |
| ජීව විද්‍යාව | 3 | 1 | 0 | 0 | **04** |
| වාණිජ්‍යය | 0 | 0 | 0 | 0 | **00** |
| කලා | 0 | 0 | 2 | 0 | **02** |
| එකතුව | ට | 29 | 46 | 106 | 202 |

ඉංජිනේරු හා වෛද්‍ය රැකියා නියුක්තිය සමග UCSC උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය රූප සටහන් 1 මගින් පෙන්වයි. ඒ සමානම සමීක්ෂණයක් බාහිර උපාධි පාඨමාලාව සඳහා ගෙන හැර පෑ විට උපාධිධාරීන් 140 කගෙන් 81% ක් රැකියා නියුක්තිකයින් වූ අතර 9% ක් රැකියා සොයන්නන් වූහ.




රූප සටහන 1: විශ්ව විද්‍යාල උපාධිධාරීන්ගේ රැකියා හැකියාව

**සම්මාන**

සම්මාන තුනක්, නම් වශයෙන් පරිගණක අධ්‍යයන සඳහා මහාචාර්ය මොහාන් මුණසිංහ සම්මානය, ඩේවිඩ් පීරිස් සමූහ රන් පදක්කම සහ මහාචාර්ය වී. කේ. සමරනායක පදක්කම UCSC වඩාත්ම කැපී පෙනෙන උපාධිධාරියා වූ ඒ. ඩී. එස්. ජයතිලක හට ප්‍රදානය කෙරිණි. CINTEC සම්මානය එම්. එම්. ඒ. වී. එන්. මාන්නප්පෙරුමට හිමි වූ අතර Vistusa Academic Excellence සම්මානය එම්. ආර්. බී. මුදන්නායකට හිමි විය. ICT උපාධි වැඩසටහන සඳහා හඳුන්වා දුන් සම්මාන 3 ඊළඟ උපාධි ප්‍රදානෝත්සවයේ සිට ලබා දීමට නියමිතය.

අප විසින් බිහි කරනු ලබන ශිෂ්‍යයන්ගේ ගුණාත්මක භාවය කෙරෙහි එය දායක වන බැවින් යහපත් ශිෂ්‍යයන් ආකර්ෂණය කර ගැනීම අප සැලකිලිමත් වන මූලික කරුණ වේ. උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයන් තෝරාගැනීම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC) විසින් මධ්‍යගතව සිදු කරයි. එය සිසුන්ගේ අභිමතය මත පදනම් වේ. වර්තමානයේ බොහෝ සිසුන්ගේ පළමු තේරීම ඉංජිනේරු හෝ වෛද්‍ය වේ. එසේම බොහෝ සිසුන් UCSC උපාධි වැඩසටහන් සහ පරිගණක ක්ෂේත්‍රයේ වෘත්තීය අවස්ථාවන් පිළිබඳ නොදැනුවත්ය. එම නිසා දෙදින වැඩමුළු හැකියාව ඇති හොඳ සහභාගිත්වයකින් යුත් නව ඇතුළත් වීම් සඳහා සංවිධානය කිරීම නොනවත්වා UCSC කරගෙන යයි. මේ දක්වා අභ්‍යන්තර වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමේ අවස්ථාව ඒ සඳහා උනන්දුවක් දක්වන්නන් හට හිමි වී නොමැත.

පශ්චාත් උපාධි අධ්‍යාපනය

පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ඔස්සේ 1986 කොළඹ දී පශ්චාත් උපාධි පාඨමාලා ප්‍රථම වරට ප්‍රදානය කරන ලදී. වර්තමානයේ UCSC විද්‍යාපති උපාධි පාඨමාලා 3 ක් ප්‍රදානය කරන අතර පර්යේෂණ උපාධිවල ශිෂ්‍යයන් 531 ක් සිටී (වගුව 4). 1990 සිට සිසුන් 147 කට පරිගණක විද්‍යාපති උපාධි ප්‍රදානය කර ඇත. 2000 සිට සිසුන් 136 කට තොරතුරු තාක්ෂණ වැඩසටහන් ප්‍රදානය කර ඇත. තොරතුරු සුරක්ෂිතතා වැඩසටහන්ගේ පළමු කණ්ඩායමෙහි 25 දෙනෙක් සිටී. නව ජෛව තොරතුරුවේදය (Bioinformatics) වැඩසටහන ආරම්භ කිරීමට සූදානම්ය. දර්ශනපති/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා සිසුන් 46 ක් පර්යේෂණ සිදු කරමින් සිටී.

වගුව 4: පශ්චාත් උපාධි වැඩසටහන්

| පාඨමාලාව | 2011 ඇතුළත් කර ගැනීම | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | එකතුව | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යාපති | 60 | 80 | 67 | 15 | 13 | 235 | 26 |
| තොරතුරු තාක්ෂණපති | 57 | 72 | 64 | 27 | 10 | 230 | 42 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තොරතුරු සුරක්ෂිතතාවය පිලිබඳ විද්‍යාපති | 26 | 25 | 0 | 0 | 0 | 51 | 0 |
| උසස් පරිගණකකරණ විද්‍යාපති | 0 | 0 | 0 | 0 | 07 | 7 | 01 |
| උසස් පරිගණකකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 0 | 0 | 0 | 0 | 01 | 1 | 08 |
| පරිගණක විද්‍යා විද්‍යාපති | 0 | 0 | 0 | 0 | 03 | 3 | 05 |
| පරිගණක විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 04 |
| තොරතුරු තාක්ෂණ විද්‍යාපති | 0 | 0 | 0 | 0 | 04 | 4 | 04 |
| තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 04 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා එකතුව | 143 | 177 | 131 | 42 | 38 | 531 | 94 |
| දර්ශනපති | 13 | 13 | 07 | 07 | 06 | 46 | 01 |
| එකතුව | 156 | 190 | 138 | 49 | 44 | 577 | 95 |

සියලු පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත් වේ.

**විශාරද වැඩසටහන්**

විවිධාකාර කොට්ඨාශවල පුද්ගලයින් සඳහා එක් එක් වැඩසටහන් ක්‍රියාත්මක වේ.

*තොරතුරු තාක්ෂණපති (MIT)* වැඩසටහන ඉලක්ක කරනුයේ තොරතුරු හා සම්බන්ධ ක්ෂේත්‍රයක වෘත්තියමය හඹායෑම අපේක්ෂා කළ අයෙකුට වඩා ශික්ෂණයක් සහිත උපාධිධාරියෙක්ය. එසේම මෙය කළමනාකරණය , ජාලකරණය හෝ බහුමාධ්‍ය තාක්ෂණය වැනි තොරතුරු තාක්ෂණය සමග අභිවිෂාදනය වන ක්ෂේත්‍රයක බහු ශික්ෂණයකින් යුත් විශේෂඥයෙක් වීමට අදහස් කරන අයට සුදුසුය.

*පරිගණක විද්‍යාපති (MCS)* වැඩසටහන නිර්මාණය වී ඇත්තේ දැනටමත් පරිගණක උපාධියක් හිමි සහ පර්යේෂණ නිරාවරණය සහිතව පරිගණක විද්‍යා/ තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි සුදුසුකම් අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වන පරිගණක විද්‍යා/ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ටය.

*විද්‍යාවේදී තොරතුරු සුරක්ෂිතතාව (MSc IS)* වැඩසටහන නිර්මාණය කර ඇත්තේ තොරතුරු සුරක්ෂිතතාව ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වන උපාධිධාරීන්ටය. මෙම වැඩසටහන මගින් තොරතුරු තාක්ෂණය, තොරතුරු පද්ධති විගණනය සහ තොරතුරු සුරක්ෂිතතාව යන ක්ෂේත්‍රවල නිරතවන්නන් හට මධ්‍ය වෘත්තීය අවස්ථාවන් පිරිනමයි.

තොරතුරු සුරක්ෂිතතාව පිළිබඳ නව වසර 2 ක විශාරද වැඩසටහනේ සිසුන් 25 පළමු වසර අවසන් කළෝය.දැනට ඉදිරියට යන විශාරද වැඩසටහන් 2 ක් වන පරිගණක විද්‍යාව හා තොරතුරු තාක්ෂණය සඳහා සිසුන් ආසන්න වශයෙන් 150 ක් බඳවාගෙන ඇත. ජෛව තොරතුරුවේදය (Bioinformatics) යන නව විශාරද වැඩසටහන සකස් වී ඇත්තේ කොළඹ විශ්ව විද්‍යාලයේ IBMBB සමග සහයෝගීතාවය සහිතවය.

බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා

2000 දී ආරම්භ කළ බාහිර උපාධි පාඨමාලාව සඳහා 5700 ක් ලියාපදිංචි වූ අතර 678 දෙනෙක් ව්‍යාප්ති පාඨමාලාව හැදෑරිය. ඊට අමතරව, පූර්ව සමාරම්භක වැඩසටහනේ UCSC හි වසර තුළ පුහුණු කරන ලද 20,000 කට වැඩි පිරිස ගත් විට 13,841 ක් විභාග සඳහා අසුන් ගත්හ.

BIT පාඨමාලාව පමණක් එහි ආරම්භයේ සිට 27,148 ක් ආකර්ෂණය කරගත්තේය. 2011 දී නවක සිසුන් 2,365 ක් සම්බන්ධ වූහ (වගුව 5). මෙම සිසුන් රටෙහි සියලු දිස්ත්‍රික්ක පමණක් නොව එතෙර UAE ද නියෝජනය කරයි. BIT උපාධි පාඨමාලාව සැලසුම් කළ ඇතුළත් කරගැනීම් දෙගුණ කරගැනීමට මෙන්ම BIT වැඩසටහනේ පළමු විදේශීය ලියාපදිංචි උපාධිධාරීන් බිහි කිරීමට ද සමත් විය. ඉතා සුළු මුදලකට අමාත්‍යාංශය මගින් NODES මධ්‍යස්ථාන හරහා පරිගණක සම්පත් වෙත ප්‍රවේශ වීමේ අවස්ථාවද BIT සිසුන් හට සලසා දී ඇත.

වගුව 5: බාහිර උපාධි වැඩසටහන්

| පාඨමාලාව | 2011 ඇතුළත් කර ගැනීම | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | එකතුව | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා | 2365 | 3095 | 943 | 249 | 4287 | 576 |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමා | 648 | 943 | 369 | 707 | 2019 | 309 |
| තොරතුරු තාක්ෂණවේදී | 279 | 249 | 458 | 586 | 1293 | 129 |
| සියල්ල | | 3095 | 1312 | 1293 | 5700 | |

BIT සිසුන් සඳහා කාර්යසාධනය පසුගිය වසර 6 තුළ හඳුනාගත් ලියාපදිංචි හා උපාධි ලත් ප්‍රමාණයක ඉලක්ක සමග වගුව 6 මගින් ඉස්මතු කර දක්වයි.

වගුව 6: පසුගිය වසර 6 තුළ බාහිර උපාධි කාර්ය සාධනය

| බාහිර උපාධි අපේක්ෂකයන් | KPI | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|
| DIT - ඩිප්ලෝමා ඇතුළත් කරගැනීම | **2000** | 1558 | 1540 | 2052 | 2514 | 2365 |
| DIT - ඩිප්ලෝමා ලියාපදිංචි වූ | **3000** | 1904 | 2001 | 2548 | 3202 | 3095 |
| DIT - ඩිප්ලෝමා | **600** | 528 | 607 | 429 | 361 | 576 |
| HDIT - උසස් ඩිප්ලෝමා ඇතුළත් කරගැනීම | **600** | 520 | 588 | 537 | 549 | 648 |
| HDIT - උසස් ඩිප්ලෝමා ලියාපදිංචි වූ | **1500** | 1121 | 1079 | 1148 | 1172 | 1312 |
| HDIT - උසස් ඩිප්ලෝමා | **300** | 128 | 386 | 310 | 199 | 309 |
| BIT - උපාධි ඇතුළත් කරගැනීම | **300** | 159 | 236 | 258 | 228 | 279 |
| BIT - උපාධි ලියාපදිංචි වූ | **1000** | 842 | 1102 | 1126 | 1188 | 1286 |
| BIT - උපාධිධාරීන් | **150** | 108 | 138 | 161 | 140 | 129 |

ඇතුළත් කර ගැනීම්වල නැවත කරන්නන් හැර

සටහන: 2007 (DIT), 2008 (HDIT), 2009 (BIT) හි GPA මත පදනම් වූ ඇගයීම් පද්ධතියක් හඳුන්වාදීම සහ eBIT ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන විෂයමාලා සංශෝධනයක් පෙන්විය. සියලු අනිවාර්ය පාඨමාලා සමත්වීමේ අවශ්‍යතාවය ලිහිල් කිරීම මගින් 2009 උපාධිධාරීන් ප්‍රතිලාභ ලබා ගත්හ. උපාධි අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට එක් එක් පාඨමාලාවට අවම වශයෙන් D සාමාර්ථයක් තිබීම 2011 දී හඳුන්වා දී ඇත.

**උපාධි ප්‍රදානය**

2011 උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වූවන්ගේ කාර්යසාධනය වගුව 7 හි පෙන්වා ඇත. මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිධාරීන් 140කට උපාධි පිරිනැමිණි. ඔවුන්ගෙන් 113 ක් (81%) දැනටමත් රැකියා නියුක්තිකයන් වන අතර ඔවුන්ගෙන් 45 ක් (32%) වඩා හොඳ රැකියාවක් සොයති. රැකියා වියුක්තිකයන් 27 (19%) අතුරින් 12 ක් (9%) අධ්‍යාපනය සහ වෙනත් කරුණු හේතුවෙන් රැකියා සොයති.

වගුව 7: 2011 දී පැවති උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ලැබූවන්

| ඇතුළත් කර ගැනීම | පළමු | ඉහළ | පහළ | සමත් | එකතුව |
|---|---|---|---|---|---|
| BIT | 3 | 8 | 10 | 119 | 140 |

**සම්මාන**

තොරතුරු තාක්ෂණවේදී (බාහිර) උපාධියේ විශිෂ්ටතම කාර්යසාධනයට පිරිනමන මහාචාර්ය වී.කේ.

සමරනායක පදක්කම එස්. ඩී. ඩී. එන්. සිරිමෙවන් හට ප්‍රදානය කෙරිණි. හොඳම පුද්ගලික ව්‍යාපෘතිය සඳහා නව සම්මානයක් හඳුන්වා දෙනු ලැබීය. එය එස්. ඩී. ඩී. එන්. සිරිමෙවන්ට ප්‍රදානය කෙරිණි. විශ්ව විද්‍යාලයීය සමාසික 4 සඳහා විශිෂ්ඨතම e learner සම්මානය ඩබ්. ඒ. එම්. එල්. බී. කරුණාරත්න (I), ආර්. එල්. එදිරිසූරිය (II), යූ. වී. වැන්දබෝනා (III) සහ එම්. එම්. එන්. එෆ්. රසානා (IV) හට ප්‍රදානය කෙරිණි.

**ආයතන**

බොහෝ පුහුණු කිරීමේ ආයතන BIT අපේක්ෂකයන් සඳහා මුහුණට මුහුණ පන්ති සහ ඉගෙනුම් සහාය පිරිනමයි. මෙම ක්‍රියාදාමය සඳහා 200 කට අධික ආයතන සංඛ්‍යාවක් සහභාගි වන අතර සමහර අධ්‍යයන වර්ෂවල ආයතන 50 ක් පමණ වේ. UCSC එම ආයතන වෙත බලය පවරන්නේ නැති නමුත් වැඩසටහනේ ප්‍රගමනයට ඔවුන්ගේ දායකත්වය හඳුනා ගනී. සෑම වසරකම UCSC එක් එක් පාඨමාලාවල ආයතන අනුව විභාග ප්‍රතිඵල සාරාංශයක් ප්‍රකාශයට පත් කරයි. එම නිසා අයදුම්කරුවන්ට තිබෙන ආයතන හඳුනාගැනීමට සහ ඔවුන්ගේ ඉගෙනුම් ක්‍රමය සැලසුම් කිරීමට හැකි වේ. අයදුම්කරුවන්ගෙන් හරි අඩකට වඩා වැඩි සංඛ්‍යාවක් ඔවුන් විසින්ම VLE සහ මාර්ගගත/ නිර්දේශිත ද්‍රව්‍යවල සහායෙන් හැදෑරීම සිදු කරයි. 2010 / 11 දී දිස්ත්‍රික්ක 13 ක ආයතන 35 ක් අයදුම්කරුවන් 5 ක් හෝ ඊට වැඩි පිරිසක් සඳහා පුහුණුව පැවැත්වීය. ඒ අතුරින් ආයතන 8 ක් අවුරුදු තුන සඳහාම සම්බන්ධ විය (වගුව 8 හි * ලෙස සලකුණු කොට ඇත). 2010 දී උතුරු නැගෙනහිර යුද්ධය අවසාන වීම නිසා සහභාගි වන ආයතනවල සැලකිය යුතු වැඩි වීමක් සිදු වී ඇත.

වගුව 8: BIT වැඩසටහන සමග සම්බන්ධ වූ ආයතන

| දිස්ත්‍රික්කය | ආයතනය |
|---|---|
| අම්පාර | (1) ග්ලෝබල් ඉන්ස්ටිටියුට් ඔෆ් ප්‍රොෆෙෂනල් එඩියුකේෂන් |
| මඩකලපුව | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස් |
| කොළඹ | (1) අර්ත් ඉන්ටර්නැෂනල්<br>(2) *ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(3) IT වෘත්තිකයන්ගේ පදනම<br>(4) *IDM කොම්පියුටර් ස්ටඩීස්<br>(5) ඉන්ෆොටෙක් ඉන්ටර්නැෂනල්<br>(6) *මැට්‍රික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් අයිටී<br>(7) *ඕපන්ආර්ක් ස්කූල් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි<br>(8) රොටරි කළමනාකරණ මධ්‍යස්ථානය<br>(9) ෂාප් විෂන් කොම්පියුටර් ඉන්ස්ටිටියුට්<br>(10) TEC ශ්‍රී ලංකා<br>(11) වයිඩ් අවේක් කොම්පියුටර් ස්කූල් |
| ගාල්ල | (1) අර්ත් ඉන්ටර්නැෂනල්<br>(2) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස් |
| ගම්පහ | (1) * අර්ත් ඉන්ටර්නැෂනල්<br>(2) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(3) IDM කොම්පියුටර් ස්ටඩීස්<br>(4) අර්බන් කොලේජ් ෆො බිසිනස් ඇන්ඩ් ටෙක්නොලොජි |
| යාපනය | (1) BIT කෝනර්<br>(2) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(3) *Mobile@Net කොම්පියුටර් සර්විසස් |
| කලුතර | (1) ඉන්ස්ටිටියුට් ෆො කොලිටි ස්ටඩීස් |
| නුවර | (1) * ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) IDM කොම්පියුටර් ස්ටඩීස්<br>(3) ඉන්ෆොටෙක් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො අයිටී<br>(4) මැට්‍රික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් අයිටී |
| කෑගල්ල | (1) ඉන්ස්ටිටියුට් ඔෆ් කොම්පියුටර් ස්ටඩීස් |
| කුරුණෑගල | (1) * ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) ඉන්ෆොටෙක් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො අයිටී |
| මාතර | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) IDM කොම්පියුටර් ස්ටඩීස් |

| | |
|---|---|
| | (3) මැට්රික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් අයිටී |
| මොණරාගල | (1) ග්ලෝබල් ඉන්ස්ටිටියුට් ඔෆ් ප්‍රොෆෙෂනල් එඩියුකේෂන් |
| වවුනියාව | (1) රිසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස් |

UCSC විසින් සිසුන් 700 කට පමණ ව්‍යාප්ති සහතික පත්‍ර පාඨමාලාව 10 කට වඩා වැඩි ප්‍රමාණයක් නොකඩවා කරගෙන යයි. UCSC මගින් පවත්වනු ලබන CSC පාඨමාලා (වැඩසටහන්) විස්තර වගුව 9 මගින් දැක්වෙයි.

වගුව 9: CSC පුහුණු පාඨමාලා

| පාඨමාලාව | B | P |
|---|---|---|
| 3D නිරූපකරණය සහ සජීවීකරණය | 4 | 36 |
| තත්‍ය කාල සමාකරණ සඳහා 3D නිරූපකරණය | 1 | 05 |
| J2EE භාවිතයෙන් උසස් ජාවා යෙදුම් සංවර්ධනය කිරීම | 3 | 72 |
| උසස් බහුමාධ්‍ය වෙබ් නිර්මාණය සහ සංවර්ධන ශිල්ප ක්‍රම | 5 | 94 |
| AutoCAD 2008 භාවිතයෙන් පරිගණක සහායයෙන් සැලසුම් ඇඳීම | 1 | 21 |
| අංකිත වීඩියෝ නිෂ්පාදනය සහ සජීවීකරණය | 1 | 09 |
| PHP සහ MySql සමග ගතික වෙබ් සංවර්ධනය | 3 | 60 |
| ග්‍රැෆික් නිර්මාණය සහ නිර්මාණාත්මකභාවය වැඩිදියුණු කිරීම | 4 | 44 |
| කාර්යාල යෙදුම් පිළිබඳව අධිවේගී පාඨමාලාව | 2 | 27 |
| e-Learning සඳහා උපදේශාත්මක සැකසුම | 1 | 07 |
| JAVA යෙදුම් සංවර්ධනය | 3 | 71 |
| Linux පරිපාලනය | 1 | 06 |
| Linux අත්‍යවශ්‍යතා | 2 | 39 |
| Linux පද්ධති සහ ජාල ආරක්ෂාව | 1 | 05 |
| ජාල සහ පරිගණක දෘඪාංග | 1 | 33 |
| Unix Linux මූලිකාංග, ජාල සහ පද්ධති පරිපාලනය (C) | 4 | 10<br>9 |
| පුද්ගල පරිගණක පරිසරය උත්ශ්‍රේණි කිරීම සහ නඩත්තු කිරීම (C) | 2 | 19 |
| වෙබ් නිර්මාණය, සංවර්ධනය | 1 | 21 |
| එකතුව | 40 | 67<br>8 |

**විදේශීය ශිෂ්‍යයන්**

කලාපය තුළ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් ලෙස පිළිගැනීම සඳහා විදේශීය සිසුන් ආකර්ශණය කර ගැනීම වැදගත්ය. විදේශීය සිසුන් ලියාපදිංචි කිරීමේ ගණය තිබුණද කෙසේ වුවත් වෙනත් ස්ථානයක උ/ පෙ කළ සිසුන් වුවත් මෙතෙක් අයදුම් කර ඇත්තේ දේශීය සම්බන්ධතා මතය. 2011 දී විදේශීය සිසුන් ගණය යටතේ පළමු සිසුවා CS උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි විය. ඔහු එතෙර අධ්‍යාපනය හැදෑරූ දේශීය සිසුවෙකි. වගුව 10 මගින් විදේශීය සිසුන් ඇතුළත් කර ගැනීමේ විස්තර දක්වා ඇත..

වගුව 10: විදේශීය ශිෂ්‍යයන්

| පාඨමාලාව | මාධ්‍යය | 2011 ඇතුළත් කර ගැනීම | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යාව | ඉංග්‍රීසි | 01 | 01 | - | - | - | - |

ආරම්භ කළ නව පාඨමාලා

HETC අරමුදල් සම්පාදනය ඔස්සේ අමාත්‍යාංශය විසින් ICT කුසලතා වැඩිදියුණු කිරීමේ සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහනක් දියත් කෙරිණි. අමාත්‍යාංශය සතු NODES මධ්‍යස්ථාන භාවිතයෙන් UCSC විසින් ඉගෙනුම් ද්‍රව්‍ය සංවර්ධනය සහ මාර්ගගතව විභාග පැවැත්වීම වර්ධනය විය. ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය ආවරණය කළ මෙම පූර්ව සමාරම්භක වැඩසටහනට දිවයින පුරා සිසුන් 16,000 ක් සහභාගි වූහ.

BIT වැඩසටහන සඳහා ශිෂ්‍යයන් තෝරාගන්නා ඉ-පරීක්ෂණය නොකඩවා පැවැත්වූ අතර වරලත් ගණකාධිකරණ ආයතන (ICA) ශිෂ්‍යයන්ගේ පරීක්ෂණ පරසරය සඳහාද එවැනිම පරීක්ෂණයක් ක්‍රියාවට නැංවීය. ආරම්භ කරන ලද නව පාඨමාලාවල තොරතුරු වගුව 11 හි දැක්වේ.

වගුව 11: නව පාඨමාලා

| පාඨමාලාව | මාධ්‍යය | සහතික | ඩිප්ලෝමා | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | විශාරද | දර්ශනපති | පශ්චාත් උපාධි |
|---|---|---|---|---|---|---|---|
| මාර්ගගත IT සහ ඉංග්‍රීසි | ඉංග්‍රීසි | | - | - | - | - | - |

පර්යේෂණ

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන

විවිධ පර්යේෂණ කණ්ඩායම් යටතේ හා පර්යේෂණ ශිෂ්‍යයන් හරහා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක වෙයි (වගුව 13). ප්‍රධානවම පර්යේෂණ කටයුතුවල උන්නතියට යොමු වන දර්ශනපති වැඩසටහන් සඳහා පූර්ණකාලීන / අර්ධකාලීනව (FT/ PT) පරිගණක විද්‍යාව / ඉංජිනේරු උපාධිවල යහපත් පළමු මට්ටමේ ප්‍රතිඵල සහිත උපාධිධාරීන් ඇතුළත් කර ගනී. නව සිසුන් 6 දෙනෙකු වසර තුළ ලියාපදිංචි වූ අතර එක් ඇගයීමක් පැවැත්විණි. වර්තමානයේ UCSC හි ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් 13 ක් යටතේ සිසුන් 31 දෙනෙකු විෂය ධාරා 13 ක් යටතේ වැඩ කරයි. වසර තුළ දර්ශනපති ශිෂ්‍යයන් 10 කගේ ප්‍රකාශන තිබුණි.

වගුව 12: කාර්ය මණ්ඩල පර්යේෂණ වපසරීන්

| පර්යේෂණ වපසරිය | FT | PT | එකතුව | නව |
|---|---|---|---|---|
| ජෛවතොරතුරු වේදය | 0 | 1 | 1 | 0 |
| පරිගණක ග්‍රැෆික් | 1 | 2 | 3 | 0 |
| මෘදුකාංග ඉංජිනේරු | 0 | 1 | 1 | 0 |
| දත්ත කැණීම | 1 | 0 | 1 | 0 |
| අංකිත අධිකරණ වෛද්‍ය විද්‍යාව | 1 | 0 | 1 | 0 |
| ඉ-ව්‍යාපාර | 0 | 2 | 2 | 0 |
| ඉ-ඉගෙනුම | 2 | 1 | 3 | 1 |
| GIS | 2 | 1 | 3 | 0 |
| ඉහළ කාර්යසාධනය | 1 | 1 | 2 | 1 |
| අනුරූ සැකසුම | 1 | 2 | 3 | 1 |
| යන්ත්‍ර ඉගෙනුම | 3 | 4 | 7 | 3 |
| දේශීය භාෂාව | 0 | 1 | 1 | 0 |
| සංවේදක ජාල | 1 | 2 | 3 | 0 |
| එකතුව | 13 | 18 | 31 | 6 |

UCSC හි පර්යේෂණ ප්‍රවර්ධනය සඳහා පර්යේෂණ අරමුදලක් 2009 දී පිහිටුවනු ලැබිණි. වසර කිහිපයක් තුළ මිලියන 10 ක් දක්වා වර්ධනය වී ඇති අරමුදලට විද්‍යාපති සහ බාහිර උපාධි වැඩසටහන් යන දෙකම

වාර්ෂිකව දායක විය. ජ්‍යෙෂ්ඨ ආචාර්ය මණ්ඩලයට පර්යේෂණ හමුවන් සඳහා සහභාගී වීමට සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සඟරාවල පර්යේෂණ පළ කිරීමට වාර්ෂිකව රු. 250,000 දක්වා උපයෝජනය කරගත හැකි විය. වර්ෂය තුළ පළවූ ප්‍රකාශන අතුරින් 58 ක් රටවල් 19 ක සම්මන්ත්‍රණ පත්‍ර වල පළ විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 21 (58%) දෙනෙක් පර්යේෂණ පත්‍ර පළ කළහ. ප්‍රකාශනවල විස්තර වගුව 13 මඟින් ලබාදෙයි.

වගුව 13: පර්යේෂණ සාරාංශය

| විෂයය | පළකළ | වෙළඳ පොළගත කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පර්යේෂණ සංඛ්‍යාව | 87 | - | 58 |
| නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| සඟරා සංඛ්‍යාව | 4 | - | - |
| පොත් සංඛ්‍යාව | 1 | - | - |
| ලිපි සංඛ්‍යාව | 58 | - | - |
| වෙනත් | - | - | - |
| එකතුව | 63 | - | 58 |

**සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළු**

උචිත පර්යේෂණයක් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණ සකස් කිරීම UCSC හි අනෙකුත් මූලෝපායකි. UCSC හි අවසාන වසර උපාධි අපේක්ෂකයන්ගේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධානය කිරීම නොකඩවා සිදුවිය. ආචාර්ය මණ්ඩලය සිදුකළ පර්යේෂණ පතල කිරීමට මේ වසරේ එතෙර බාහිර පරීක්ෂකයෙකුගේ සහභාගිත්වය ඇතිව පර්යේෂණ දිනයක් හඳුන්වා දුනි. ICTer සඟරාවේ නිකුතු 2 ක් ප්‍රකාශයට පත් කිරීම ද නොකඩවා UCSC විසින් සිදු කරන ලදී. නැගී එන කලාපයන් පිළිබඳ ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ සම්මන්ත්‍රණය සහ INET සම්මන්ත්‍රණ වැඩමුළු සත්කාර UCSC හි දී සංවිධානය කෙරිණි. තවදුරටත් පර්යේෂණ සඳහා සම්බන්ධ වීමට සියලු අධ්‍යාපනඥයන් ධෛර්යමත් කිරීමට පර්යේෂණ අරමුදල ප්‍රයෝජනයට ගැනීමේ යාන්ත්‍රණය ප්‍රතිසංශෝධනය කරන ලදී.

UCSC විසින් මහාචාර්ය වී. කේ. සමරනායක දේශනය සාර්ථක ලෙස පැවැත්වූ අතර මහාචාර්ය වී. කේ. සමරනායක පරිත්‍යාග අරමුදලට නව අරමුදල් රැස් කර ගැනිණි. සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළු පිළිබඳ විස්තර වගුව 14 හි දැක්වේ.

වගුව: සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළු

| විෂයය | සහභාගි වූ | පළකළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයන්ගේ දේශීය සම්මන්ත්‍රණය | 22 | 1 | 0 |
| ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයන්ගේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | 17 | 46 | 6 |
| පර්යේෂණ සමුළුව (ආචාර්ය මණ්ඩලය) | 20 | 0 | 13 |
| UCSC පරිසංවාදය (උද්ධෘත) | 150 | 48 | 13 |
| සංවිධානය කළ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICTer) | 175 | 32 | 19 |
| සංවිධානය කළ ජාත්‍යන්තර වැඩමුළුව | 122 | 0 | 0 |
| ICTer සඟරාව | 25 | 10 | 0 |
| Total | 531 | 137 | 51 |

ලද සම්මාන

ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගි වීමට ශිෂ්‍යයන් හා ආචාර්ය මණ්ඩලය දිරිමත් කිරීම UCSC විසින් නොකඩවා සිදු කරයි. පසුගිය අවසන් වසර කිහිපය අවසන් වන විට UCSC විසින් NBQSA, e-Swabhimani, APICTA සහ Manthan විසින් ප්‍රදානය කළ විවෘත සම්මාන ගණනාවක් දිනාගෙන ඇත. ශිෂ්‍යයන් Imagine Cup සහ වෙනත් ඉසව් වලින් විශිෂ්ඨතා දක්වා ඇත.

ශ්‍රී ලංකා CERT විසින් සංවිධානය කළ තොරතුරු සුරක්ෂිතතා පැණ විසඳුම් තරඟය ශිෂ්‍යයන් කණ්ඩායමක් විසින් ජයග්‍රහණය කරන ලදී. තවත් කණ්ඩායමක් NBQIA හිදී විශේෂ පැසසුමට ලක් විය. සම්මාන ලැබීම පිළිබඳ දත්ත වගුව 15 හි දැක්වේ.

වගුව 15: පර්යේෂණ සම්මාන

| විෂයය | සම්මාන සංඛ්‍යාව | අධ්‍යාපනඥයන් සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය සම්මාන | 2 | 1 | 3 |
| ජාතික සම්මාන | - | - | - |
| ජාත්‍යන්තර සම්මාන | - | - | - |
| වෙනත් | - | - | - |
| එකතුව | 2 | 1 | 3 |

අධ්‍යයන කාර්ය මණ්ඩලය

වසර තුළ ස්ථිර උපදේශකයින් තුන් දෙනෙක් කථිකාචාර්ය (පරිවාස) තත්ත්වයට උසස් කර, එක් කථිකාචාර්යවරයෙක් (පරිවාස) බඳවාගෙන තවත් අයෙකුගේ සේවය අවසන් කරන ලදී. එක් අධ්‍යාපනඥයෙක් සහ පරිපාලකයෙක් සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් අතර තවත් අධ්‍යනඥයෙක් ඔහුගේ සප්ත වාර්ෂික නිවාඩු අවසන් කර නැවත පැමිණියේය. කෙසේ වුවද හිස් වී ඇති තනතුරු සඳහා අවශ්‍ය පුද්ගලයින් බඳවා ගැනීමට UCSC අසමත් විය. අධ්‍යයන සහ අධ්‍යයන සහායක තනතුරු 72 කින් 38 ක් පමණක් සම්පූර්ණ කෙරිණි. පෞද්ගලික ක්ෂේත්‍රයේ ඉතා හොඳ අපේක්ෂාවන් ඇති බැවින් තාක්ෂණික පුහුණුව ලැබූවන් රඳවා ගැනීම සහ හොඳ තරුණ ශාස්ත්‍රඥයින් ආකර්ෂණය කර ගැනීම අතිශයින් දුෂ්කරය. ස්ථිර කාර්ය මණ්ඩලය දවසේ වැඩකටයුතු කරගෙන යන අතරතුර UCSC ඔවුන්ගේ ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී බාහිර කාර්ය මණ්ඩලය කෙරෙහි විශ්වාසය තබයි.

ජාත්‍යන්තර මට්ටමේ මානව සම්පත් ආකර්ශණය කර ගැනීම පිණිස ඕස්ට්‍රේලියාව, ස්වීඩනය, එක්සත් රාජධානිය සහ ඇ.එ.ජ. බාහිර පර්යේෂකයින් කෙටිකාලීනව මෙම වසර තුළ ගෙන්වාගෙන ඇත. UCSC විසින් පළමු කාර්යය මණ්ඩල හුවමාරු වැඩසටහන ස්වීඩනයේ Umea විශ්ව විද්‍යාලයේ Linuaeus Palme ව්‍යාපෘතිය යටතේ සිදුකළ අතර UCSC කාර්ය මණ්ඩල සාමාජිකයෙක් සාර්ථකව Umea විශ්ව විද්‍යාලය තුළ පාඨමාලාවක් මෙහෙයවූයේය.

අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ දත්ත වගුව 16 හි දැක්වේ.

වගුව 16: අචාර්ය මණ්ඩල පර්යේෂණ වපසරින්

| විෂයයන් | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහාය කථිකාචාර්ය | උපදේශක |
|---|---|---|---|---|---|---|---|
| පරිගණකකරණය (P) | ඉංග්‍රීසි | - | 02 | 18 | 16* | - | 02 |
| පරිගණකකරණය (C) | ඉංග්‍රීසි | - | - | - | 02 | - | 08 |

*09 නිවාඩු පිට

අනධ්‍යයන කාර්ය මණ්ඩලය: ස්ථිර (P) කොන්ත්‍රාත්/පැවරුම් (C/A)

කළමනාකරණ හා උපාය මාර්ගික තොරතුරු පද්ධතියක් දියුණු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්නය දරනු ලැබිය. විභව්‍ය පුද්ගලයන්ගේ අල්ප සම්බන්ධවීම නිසා ප්‍රතිඵලය දිරිගන්වන සුළු නොවීය. කරගෙන යන විභාග සැකසුම් පද්ධතියේ ක්‍රියාත්මක වැඩ අඛණ්ඩව කරගෙන යන ලදී. බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන් හා පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා මාර්ගගතව ගෙවීමේ පහසුකම හඳුන්වා දෙන ලදී. UCSC හි මූල්‍ය පද්ධතිය උත්ශ්‍රේණි කළ අතර පුස්තකාලය සඳහා පරික්ෂණ හා RFID පාදක කරගත් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

UCSC හි අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර වගුව 17 හි දැක්වේ. UCSC තුළ අනධ්‍යයන කාර්ය මණ්ඩලය හා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය 100 ක් අනුමතවී තිබුණද ස්ථිර පත්වීම් 35 ක් පමණක් පුරවා ඇති අතර බොහෝ වැඩ කොන්ත්‍රාත් සහ පැවරුම් කාර්ය මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

වගුව 17: අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| වර්ගය | වධාත්ම ජ්‍යෙෂ්ඨ (පරිපාලන) | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කණිෂ්ට කාර්ය මණ්ඩලය | සුළු සේවකයන් | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|
| P | 5 | 4 | 20 | 6 | - |
| C | - | 4 | 20 | 11 | 14 |
| A | - | 2 | - | - | - |

මූල්‍යය

පුනරාවර්තන වියදම්

භාණ්ඩාගාර අරමුදල් උපාධි අපේක්ෂක ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් UCSC ජනනය වන ආදායම එදිනෙදා මෙහෙයුම් සඳහා දායක කොට ගනී. එක් උපාධි අපේක්ෂක සිසුවෙක් සඳහා වියදම රු. 125,000 කි. UCSC එහි ජනනය වන ආදායමෙන් 28% ක් වන රු. මිලියන 22 කින් අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහනට දායක විය. පුනරාවර්තන වියදම් වල බිඳ වැටීම 18 වන වගුවේ දැක්වේ.

වගුව 18: පුනරාවර්තන වියදම්

රු. 000'

| විෂයය | 2010 | 2011 |
|---|---|---|
| පුද්ගල වේතන | 68,015 | 79,931 |
| ගමන් වියදම් | 484 | 1,132 |
| සැපයුම් | 3,895 | 4,227 |
| නඩත්තු | 2,906 | 3,627 |
| කොන්ත්‍රාත්තුමය සේවා | 23,453 | 26,675 |
| වෙනත් | 54,672 | 56,915 |
| එකතුව | 153,425 | 172,507 |
| රජයේ ප්‍රතිපාදන | 65,381 | 83,102 |

ප්‍රාග්ධන වියදම්

UCSC එහි පරිගණක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා භෞතික සම්පත්වල ආයෝජනය කර ඇත. ඉ-පරීක්ෂාව සඳහා සහ දහර වීඩියෝ හා පවතින ද්‍රව්‍යවල සැනෙළි වීඩියෝ සඳහා සේවාදායක පිහිටුවන ලදී. ජාලකරණ මෙහෙයුම් මධ්‍යස්ථානයේ උපකරණ ඉහල තැරුම් ආදානයක් සඳහා උත්ශ්‍රේණි කරනු ලැබිය. ප්‍රාග්ධන වියදම්වල තොරතුරු වගුව 19 හි දී ඇත.

වගුව 19: ප්‍රාග්ධන වියදම්

රු. 000'

| විෂයය | 2010 | 2011 |
|---|---|---|
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ අත්පත් කරගැනීම් | 6,043 | 2,656 |
| යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම් | - | - |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත් කරගැනීම් | - | 15,420 |
| වෙනත් | 15,257 | 10,099 |
| එකතුව | 21,300 | 28,175 |
| රජයේ ප්‍රතිපාදන | 3,420 | 16,000 |

ව්‍යාපෘති (දේශීය/විදේශීය අරමුදල් සැපයූ)

UCSC සතුව විෂයයන් ගණනාවක ප්‍රබල පර්යේෂණ කණ්ඩායමක් ඇත. ඒවා අතුරින් ආදර්ශකරණය හා විඩම්බනය, ඉ-ඉගෙනුම හා භාෂා තාක්ෂණය යනාදිය පරිශීලක සමාජයට ලබා වී ඇත. UCSC හි ශක්තිමත් කාර්මික විශ්ව විද්‍යාලයීය සහයෝගීතාවයක් මෙන්ම සහයෝගාත්මක අන්තර් ශික්ෂණයකින් යුතු පර්යේෂණ සංස්කෘතියක් ද ගොඩනංවා ඇත. NSF සහ NRC අරමුදලින් Orel Solutions සහ තවත් කිහිප දෙනෙක් සමග රු. මිලියන 1.5 ක කාර්මික සහයෝගීත් ව්‍යාපාතියක් මූලාරම්භ කෙරිණි. Sida අරමුදලින් ව්‍යාපෘති 3 ක් (ජාලකරණය, PhD, NeLC) සාර්ථකව නිමා කරන ලද්දේ M-ATM, Tikiri DB, VIPNet වැනි පර්යේසණ වැඩ ව්‍යාපෘති සමග අඛණ්ඩව කරගෙන යන අතරතුරදීය.

පර්යේෂණ පාදක කරගත් ව්‍යාපෘතීන්ට අමතරව UCSC රාජ්‍ය හා පෞද්ගලික අංශ වලට උපදේශක සේවාවන් ද සපයයි. අතීතයේ කරන ලද වැඩ පිළිබඳව UCSC හට මනා ප්‍රසිද්ධියක් ඇත. 1981 සිට ජාතික මැතිවරණයන්ට සහාය දක්වා ඇත. UCSC හි මෘදුකාංගයක් භාවිතයෙන් දැන් උපත්, විවාහ සහතික එවෙලාවෙහිදීම නිකුත් කරනු ලබයි. සිංහල යුනිකෝඩ් සැලසුම්කර හා දියුණු කිරීමේ UCSC උත්සාහයන් නිසා නවීන පරිගණක සිංහල භාෂාවට සහාය දක්වයි.

විශ්ව විද්‍යාලයීය ප්‍රතිපාදන කොමිසම සඳහා විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන් තෝරා ගැනීම සහ වෙන්කිරීමේ පද්ධතියේ ක්‍රියාත්මක කිරීම UCSC මගින් කරන ලද ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම් වලින් එකකි. මෙය සැලකිය යුතු මට්ටමින් විශ්ව විද්‍යාලීය අතුළත් කර ගැනීම් සඳහා ගතවන කාලය අවම කරන්නා සේම ක්‍රියාවලියේ නිවැරදි බවද තහවුරු කරයි. ICA හි නිල මඩුල්ල තෝරා ගැනීමට භාවිතා කරන ස්පර්ශක තිර පදනම් ඡන්ද පද්ධතිය ක්‍රියාවට නැංවීමද UCSC මගින් සිදුවිය. විශ්ව විද්‍යාලයීය ප්‍රතිපාදන කොමිසමට හා අනෙකුත් විශ්ව විද්‍යාල ගණනාවක් සඳහා ඉ-පරීක්ෂණ පදනම් කොටගත් බඳවාගැනීම් ඉ-ඉගෙනුම් මධ්‍යස්ථානය හරහා සිදු කෙරේ. උසාවි නඩුවල අංකිත අධිකරණ ක්‍රියාකාරකම් සිදු කිරීමද UCSC විසින් අඛණ්ඩව කරගෙන යයි.

උනන්දුවක් දක්වන ප්‍රධාන පාර්ශ්වයන් සමග උපායමාර්ගික සම්බන්ධතා පවත්වා ගන්නා අතරම රටේ ඉ-රාජ්‍ය ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සහ රජයේ අමාත්‍යාංශ සහ HETC සමග නව ව්‍යාපෘති ආරම්භ කිරීම නොකඩවා කරගෙන යයි. UDG, PGD සහ EEP අරමුදල්කරණය යටතේ UCSC විසින් HETC සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලදී. කෙසේ වුවද UCSC සාර්ථක වූයේ EEP යෝජනාවෙහි දී පමණි. ලෝක බැංකු අරමුදල්කරණය ඔස්සේ UCSC විසින් භූතාන රාජකීය විශ්ව විද්‍යාලය සඳහා ඉ-ඉගෙනුම් රාමුවක් ක්‍රියාවට නංවන ලදී. UCSC හට අයිති සමාගමක් වන තීක්ෂණ විසින් ආසන්න වශයෙන් රු. මිලියන 15 ක් උත්පාදනය කළ අතර එයින් රු. මිලියන 8 කට වඩා විදේශ විනිමය විය. UCSC විසින් සිදුකළ ව්‍යාපෘතිවල විස්තර වගුව 20 හි ලැයිස්තුගත කර ඇත.

රු. 000'

| නම සහ විස්තර | ප්‍රදානය | අරමුදල්කරණ නියෝජිතායතනය | TCE | RFA | DF |
|---|---|---|---|---|---|
| LTRL (2010-11) | 18,845 | IDRC, කැනඩාව | | | |
| M-ATM (2008-11) | 6,566 | තාක්ෂණය පිළිබඳ රාජකීය අධ්‍යයනායතනය.(KTH), ස්වීඩනය | | | |
| Tele centre.Org (2010-11) | 1,948 | ටෙලිසෙන්ටර් පදනම, පිලිපීනය | | | |
| Tikiri DB (2010-2012) | 1,751 | පරිගණක විද්‍යාව පිළිබඳ ස්වීඩන ආයතනය, ස්වීඩනය | | | |
| VIP Net (2010-2011) | 1,357 | APNIC (පුද්) සමාගම, ඕස්ට්‍රේලියාව | | | |
| Linnaus Palm (2011) | 100 | Linnaus Palm, ස්වීඩනය | 100 | 100 | |
| විදේශීය අරමුදල් | | | | | |
| FASS (2011-2012) | 408 | ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව | 408 | 408 | |
| Orange (2011-2012) | 1,500 | සොලියුෂන්ස් (පුද්) සමාගම, ශ්‍රී ලංකාව | 1,500 | 1,500 | |
| කොප්සයුර (2011-13) | 1,628 | ජාතික විද්‍යා පදනම | 1,628 | 1,628 | |
| විදුසවිය (2011) | 50 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 50 | 50 | |
| දේශීය අරමුදල් | 1,908 | | | | |

TCE – ඇස්තමේන්තුගත මුළු පිරිවැය; RFA – අයදුම් පත්‍රය සඳහා ඉල්ලීම; DF – වට්ටම් සාධකය

ව්‍යාපෘති වියදම (දේශීය/විදේශීය අරමුදල් සැපයූ)

Rs. 000'

| නම | TCE ඉ/ගෙ නිවැරදි පිරිවැය | 2010 දී වියදම | 2011 දී වියදම | 31.12.2011 දිනට සමුච්චිත වියදම | % භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| LTRL | 16,469 | 2,718 | 1,956 | 21,143 | 100% |
| M-ATM | 1,855 | 2,314 | 3,359 | 7,528 | 80% |
| Tele centre.Org | 120 | 1,828 | 462 | 2,410 | 100% |
| Tikiri DB | - | 1,435 | 378 | 1,813 | 60% |
| VIP Net | - | 1,358 | 1,059 | 2,417 | 100% |
| විදේශීය ව්‍යාපෘති වියදම | 18,444 | 9,653 | 7,214 | 35,311 | |
| FASS | - | - | 40 | 40 | 30% |
| Orange | - | - | 645 | 645 | 50% |
| දේශීය ව්‍යාපෘති වියදම | - | - | 685 | 685 | |

මූල්‍ය ප්‍රගතිය (වියදම්)

Rs. 000'


| විෂයය | ප්‍රතිපාදනය | වියදම | ඉතුරුම්/අතිරික්තය |
|---|---|---|---|
| ව්‍යාපෘති හැර පුනරාවර්තන | 180,107 | 172,507 | 7,600 |
| ව්‍යාපෘති හැර ප්‍රාග්ධන | 87,463 | 28,175 | 59,288 |
| ව්‍යාපෘතිය - දේශීය අරමුදල් සැපයූ | 745 | 745 | - |
| ව්‍යාපෘතිය – විදේශීය අරමුදල් සැපයූ | 5,402 | 5,402 | - |
| එකතුව | 273,717 | 206,829 | 66,888 |

මූල්‍ය ප්‍රගතිය (උත්පාදනය කළ ආදායම)

Rs. 000'

| ආදායම් මූලාශ්‍රය | ප්‍රතිපාදනය | රැස් කිරීම | ඌනතාවය / අතිරික්තය |
|---|---|---|---|
| උපාධි අපේක්ෂක අධ්‍යයන | 88,646 | 87,981 | 665 |
| පශ්චාත් උපාධි අධ්‍යයන | 26,987 | 55,595 | (28,608) |
| උපදේශන | 39,341 | 31,045 | 8,296 |
| බාහිර උපාධි | 51,761 | 72,845 | (21,084) |
| වෙනත් | - | - | - |
| එකතුව | **206,735** | **247,466** | **(40,731)** |

උපාධි අපේක්ෂකයන්ගේ ආදායම හැර UCSC විසින් 159,485 ක් උපයන ලදී. UCSC හි උත්පාදනය කළ ආදායම එහි ප්‍රධාන විශ්ව විද්‍යාලය ඇතුළු බොහෝ විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වලට වඩා ඉතා ඉහළ විය.




මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

රු. 000'

| විෂයය | සූත්‍රය | එක් ශිෂ්‍යයෙක් සඳහා වියදම |
|---|---|---|
| එක් ශිෂ්‍යයෙක් සඳහා පුනරාවර්තන වියදම (RE) | RE / ශිෂ්‍ය බලයේ සංඛ්‍යාව | 125 |
| ශිෂ්‍යයෙක් සඳහා ප්‍රාග්ධන වියදම (CE) | CE / ශිෂ්‍ය බලයේ සංඛ්‍යාව | 38 |
| එකතුව | | 163 |

2011 දී ලද යටිතල පහසුකම්

සීමිත ඉඩක ක්‍රියා කරන UCSC හට දේශන පැවැත්වීමටද ප්‍රමාණවත් ඉඩක් නැත. ශිෂ්‍යයන් සඳහා ප්‍රමාණවත් ඉඩක් භෝජනාගාරය, පොදු සහ ඉගෙනුම් කාමර තුළ නැත. විශ්ව විද්‍යාලයට බිමක් ලබා දීමට නොහැකි බැවින් UCSC බටහිර අංගන ගොඩනැගිලි හා හතරවන ව්‍යාප්ත කොට ගොඩනැගීම ආරම්භ කළේ උපාධි අපේක්ෂකයින් පන්ති කාමරවල අඩුව සම්පූර්ණ කිරීමට සහ පූර්ණ කාලීන පර්යේෂණ සිසුන්ගේ නවාතැන් සඳහාය.

කෙටිකාලීන යටිතල පහසුකම්වල අවශ්‍යතාවයට මුහුණදෙන අතර පුළුල් කිරීමේ සැලසුම් මධ්‍ය හා දිගු කාලීන අරමුණු වලට මුහුණ දෙන අයුරින් සැලසුම් කරන ලදී. දැනට භෝජනාගාරය පවතින ස්ථානයේ භෝජනාගාර හා පාලක ගොඩනැගිල්ලේ ගොඩනැගීම සහ දේශන ශාලා / අධ්‍යයන කාමර මගින් දැනට පවතින ශ්‍රවණාගාරය ප්‍රතිස්ථාපනය කිරීම මධ්‍යකාලීන අරමුණු අතර වේ. දිගුකාලීන අරමුණු ලෙස කොළඹ විශ්ව විද්‍යාලයට පිටතින් ගොඩනැගිලි ඉදි කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනිණි. ගොඩනැගිලි වැඩවල තොරතුරු පහත දැක්වේ.

රු. 000'

| යටිතල පහසුකම් විස්තර | වියදම් (රු) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| UCSC Building Extension | 15,420 | 30% |

වෙනත් යම් තොරතුරු/ මෙම වාර්තාවට අදාළ කාර්ය සාධනය

දේශීය හා ජාත්‍යන්තර ප්‍රසිද්ධිය වැඩි කිරීම සඳහා UCSC හි ක්‍රියාකාරකම්වල මුද්‍රණ මාධ්‍ය ආවරණය නඩත්තුව සමග UCSC හි වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය මගින් පෙනී සිටීම වැඩිදියුණු කරන ලදී.

තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ නිෂ්පාදන පර්යන්තය වෙත ගෙන යාම සිය සමාජයීය වගකීම් වලින් එකක් ලෙස UCSC සලකයි. උසස් පෙළ සිසුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් හඳුන්වා දීමේදී රූපවාහිනී සංස්ථාව සමග කොටස්කරුවෙක් බවට UCSC මෙම වසර තුළ පත් විය. සෑම උදෑසනකම 9 සිට 10 දක්වා පවත්වන SLBC රේඩියෝ වැඩසටහන හරහා ප්‍රජා අතුරු මුහුණතක් වීම ද UCSC අඛණ්ඩව කරගෙන යයි. ජාත්‍යන්තර ඔලිම්පියඩ් තොරතුරු විද්‍යාව ඇතුළු මෘදුකාංග තරඟමාලා පැවැත්වීම සඳහා ද UCSC සිය සහාය අධ්‍යාපන අමාත්‍යාංශයට සහ පාසල් වලට ලබා දේ.

විශ්ව විද්‍යාලය තුළ හා පිටත යන දෙකෙහිදීම සමාජයීය වගකීම හුරු කරවීමට UCSC විසින් මනා ඉඩ ප්‍රස්ථාවක් ශිෂ්‍යයන්ට ලබා දෙයි. ශිෂ්‍යයන් විසින් විවිධාකාර වැඩමුළු සංවිධානය කරන ලදී. පළමු වතාවට UCSC මගින් කාර්ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල අයට වෙන්නායි වෙත සුභසාධක චාරිකාවක් ලබා දීම මගින් ඔවුන්ට ජාත්‍යන්තරය වෙත නිරාවරණය වීමේ අවස්ථාව ලබා දුනි. UCSC විසින් කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණාවරණ ක්‍රමය අඛණ්ඩව කරගෙන යන ලදී.

## කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය
### කොළඹ විශ්ව විද්‍යාලය
### 2011 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය.

| | 2011<br>රු<br>N.B.V | 2010<br>රු<br>N.B.V |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපල, පිරියත සහ උපකරණ | | |
| ගොඩනැගිලි | 13,609,495 | 14,575,191 |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ. ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 63,508,994 | 65,844,162 |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 882,382 | 841,155 |
| මෝටර් රථ | 5,015,623 | - |
| එකතුව | 83,016,494 | 81,260,508 |
| පුනරුත්ථාපන හා ප්‍රාග්ධන වැඩි දියුණු කිරීම් | 31,309,842 | 34,381,973 |
| නොනිමි ඉදිකිරීම් වැඩ | 15,420,756 | |
| ජංගම වත්කම් | | |
| තොග | 2,588,631 | 3,251,260 |
| ලැබීම් හා පෙර ගෙවීම් | 33,202,229 | 35,580,959 |
| SIDA අරමුදල් | 60,429,110 | 222,763,074 |
| LEARN අරමුදල් | - | 51,256,779 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 482,533,173 | 401,219,612 |
| මුළු ජංගම වත්කම් | 578,753,143 | 714,071,684 |
| මුළු වත්කම් | 708,500,240 | 829,714,167 |
| හිමිකම් සහ වගකීම් | | |
| ප්‍රාග්ධනය සහ සංචිත | | |
| ප්‍රාග්ධනය | | |
| වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 3,361,251 | 6,976,033 |
| වැය නොකළ තොරතුරු තාක්ෂණ ප්‍රදාන | 895,466 | 895,466 |
| වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | 39,984,898 | 34,638,590 |
| වැය කළ තොරතුරු තාක්ෂණ දීමනා | 7,785,509 | 11,218,659 |
| E Learning ව්‍යාපෘතිය-ප්‍රදාන | - | (330,992) |
| E Learning ව්‍යාපෘතිය-වැය කළ | - | 28,434,793 |
| IDRC ව්‍යාපෘතිය -ප්‍රදාන | 1,076,325 | 1,076,325 |
| IDRC ව්‍යාපෘතිය -වැයකළ | 648,785 | 648,785 |
| විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘති-වැය නොකළ | 5,851,551 | 10,213,648 |
| විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘති-වැය කළ | 3,250,000 | 3,368,988 |
| විලම්බිත ප්‍රදාන | 37,430,874 | - |
| කොළඹ විශ්ව විද්‍යාලයීය දායකත්වය | 8,155,714 | 8,155,714 |
| එකතුව | 108,440,373 | 105,296,009 |
| සංචිත | 342,298,905 | 272,126,842 |
| සීමා කළ අරමුදල් | 54,954,738 | 43,215,316 |
| ජංගම නොවන වගකීම් | | |
| විශ්‍රාම ප්‍රතිලාභ | 23,393,238 | 20,233,733 |
| ජංගම වගකීම් | | |
| වෙනත් ලැබිය යුතු සහ ගෙවිය යුතු දේ | 117,960,098 | 112,930,480 |
| SIDA අරමුදල් | 60,429,110 | 222,763,074 |
| LEARN අරමුදල් | - | 51,256,779 |
| බැංකු අයිරාව | 1,023,778 | 1,891,933 |
| එකතුව | 179,412,986 | 388,842,266 |
| මුළු හිමිකම් සහ වගකීම් | 708,500,240 | 829,714,167 |

28.02.2012

..............................
අධ්‍යක්ෂ (UCSC)

..............................
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි

**කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය**

කොළඹ විශ්ව විද්‍යාලය

2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සදහා ඒකාබද්ධ ආදායම් හා වියදම් ගිණුම

| | 2011<br>රු | 2010<br>රු |
|---|---|---|
| <u>උපාධි අපේක්ෂක වැඩසටහන</u> | | |
| <u>ආදායම්</u> | | |
| රජයේ ප්‍රදාන | 83,102,728 | 65,381,575 |
| විලම්බිත ආදායම් - ප්‍රදාන | 19,778,039 | 13,011,762 |
| වෙනත් | 4,879,143 | 3,381,045 |
| | 107,759,910 | 81,774,382 |
| <u>උපාධි අපේක්ෂක වැඩසටහන - වියදම</u> | | |
| පුද්ගල වේතන | 50,717,167 | 42,753,294 |
| ගමනාගමන වියදම් | 387,447 | 221,935 |
| සැපයුම් | 2,424,562 | 2,361,498 |
| කොන්ත්‍රාත්තුමය සේවාවන් | 24,159,062 | 19,250,982 |
| විශ්‍රාම ප්‍රතිලාභ | 8,133,475 | 7,543,504 |
| ග්‍රාහක, දායකත්ව සහ සාමාජික ගාස්තු | 44,139 | 73,471 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 349,643 | 196,875 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 6,094,293 | 7,718,630 |
| ක්ෂය | 18,551,317 | 13,011,763 |
| එකතුව | 110,861,105 | 93,131,952 |
| උපාධි අපේක්ෂක වැඩසටහනන් වලින් හිගය | (3,101,195) | (11,357,570) |
| <u>ව්‍යාප්ති වැඩසටහන්</u> | | |
| විද්‍යාපති වැඩසටහන | 30,760,124 | 18,508,949 |
| බාහිර උපාධි මධ්‍යස්ථානය | 43,468,371 | 28,800,148 |
| පරිගණකකරණ සේවා මධ්‍යස්ථානය | 654,128 | 783,607 |
| උසස් අංකිත මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය | 175,248 | 680,697 |
| ඉ ඉගනුම් මධ්‍යස්ථානය | 1972517 | - |
| වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | (461,413) | (397,450) |
| ව්‍යාප්ති වැඩසටහන් වලින් අතිරික්තය | 76,568,975 | 48,375,951 |
| <u>ව්‍යාපෘති</u> | | |
| ඉ ඉගනුම් මධ්‍යස්ථානය | - | 3,905,611 |
| විදේශ අරමුදල් සැපයූ පොදු ව්‍යාපෘති | - | 568,418 |
| NeLC | - | 47,595 |
| IDRC අතථ්‍ය ගම්මානය | 65,944 | (28,602) |
| ව්‍යාපෘති වලින් අතිරික්තය | 65,944 | 4,493,022 |
| ශුද්ධ අතිරික්තය/(හිගය) | 73,533,724 | 41,511,403 |

### කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

කොළඹ විශ්ව විද්‍යාලය

2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011<br>රු | 2010<br>රු |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය | | |
| වසර සඳහා හිඟය / අතිරික්තය | 73,533,724 | 41,511,402 |
| ගැලපුම් | | |
| ක්ෂය - | 25,380,877 | 24,553,435 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 3,233,192 | 2,901,523 |
| ක්ෂය සඳහා අධි වෙන් කිරීම් | (67,655) | |
| විලම්බිත ආදායම් | (23,974,726) | (22,883,071) |
| පෙර ලැබුණු ප්‍රදාන වලින් මාරු කිරීම් | (5,245,357) | (63,331,585) |
| දේපල, පිරියත හා උපකරණ විකුණුම් ලාභය | (1,283,000) | (114,460) |
| විනිමය ප්‍රතිලාභ | (784,747) | 1,054,488 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය | 70,792,308 | (16,308,268) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් | 8,070,977 | 42,953,011 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වූ ශුද්ධ ලාභය | 78,863,285 | 26,644,744 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් | (28,430,366) | (33,523,733) |
| දේපළ, පිරියත හා උපකරණ විකුණුම් උත්පාදන | 1,283,000 | 120,010 |
| දේපළ, පිරියත හා උපකරණ පුනරුත්ථාපනය හා නඩත්තුව | (561,288) | (9,447,495) |
| | 51,154,631 | (16,206,474) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ | | |
| ලද ප්‍රාග්ධන ප්‍රදාන | 18,205,340 | 83,420,743 |
| ලද ව්‍යාපෘති ප්‍රදාන | 6,202,608 | |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති ශේෂයන් පැවරුම | (5,805,939) | |
| NeLC ව්‍යාපෘති පැවරුම | (379,400) | |
| ගෙවූ පාරිතෝෂික | (73,688) | (87,720) |
| සීමාකළ අරමුදල්වල ලැබීම් | 12,093,420 | 12,535,300 |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/ අඩුවීම | 81,396,972 | 79,661,849 |
| විනිමය ප්‍රතිලාභ/(අලාභ) | 784,747 | (1,054,488) |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | 399,327,677 | 320,720,316 |
| වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ | 481,509,395 | 399,327,677 |

## කොළඹ විශ්ව විද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනය

### මූල්‍ය ඉස්මතු කිරීම

*රු. '000*

| මූල්‍ය වර්ෂය | **2011** | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|
| <u>ශේෂ පත්‍රය</u> | | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | **481,510** | 401,220 | 327,808 | 260,935 | 201,245 | 164,656 |
| ලැබිය යුතු හා ගෙවිය යුතු | **33,202** | 35,580 | 34,859 | 32,253 | 19,219 | 13,058 |
| තොග | **2,588** | 3,251 | 2,404 | 2,126 | 1,548 | 1,859 |
| UCSC මගින් කළමනාකරණය වන SIDA අරමුදල් | **60,429** | 222,763 | 186,424 | 77,020 | 81,555 | 86,432 |
| UCSC මගින් කළමනාකරණය වන LEARN අරමුදල් | - | 51,256 | 74,896 | 49,024 | 61,861 | 27,695 |
| ප්‍රාග්ධන වත්කම් වල පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම | **31,309** | 34,381 | 21,694 | 20,455 | 18,918 | 16,231 |
| නොනිමි ඉදිකිරීම් වැඩ | **15,420** | - | - | - | - | - |
| දේපළ, පිරියත හා උපකරණ | **83,016** | 81,261 | 75,535 | 83,684 | 88,079 | 115,581 |
| *මුළු වත්කම්* | **707,474** | 829,712 | 723,620 | 525,497 | 472,425 | 425,512 |
| | | | | | | |
| ප්‍රාග්ධනය | **108,440** | 105,296 | 108,690 | 109,010 | 102,707 | 124,218 |
| සංචිත | **342,299** | 272,126 | 232,899 | 179,578 | 138,765 | 109,647 |
| සීමා කළ අරමුදල් | **54,954** | 43,215 | 30,110 | 22,528 | 19,597 | 18,457 |
| වෙනත් වගකීම් | **201,781** | 409,075 | 351,921 | 214,381 | 211,356 | 173,190 |
| *මුලු වගකීම් හා අරමුදල්* | **707,474** | 829,712 | 723,620 | 525,497 | 472,425 | 425,512 |
| | - | | | | | |
| රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන | **83,102** | 65,381 | 68,610 | 71,555 | 78,695 | 52,850 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | **16,000** | 4,920 | 4,167 | 11,055 | 10,560 | 36,740 |
| ලද මුළු රාජ්‍ය ප්‍රදාන | **99,102** | 70,301 | 72,777 | 82,610 | 89,255 | 89,590 |
| උපාධි අපේක්ෂක වැඩසටහන සඳහා පුනරාවර්තන වියදම් | **92,310** | 80,120 | 84,461 | 80,083 | 76,564 | 65,617 |
| ප්‍රාග්ධන වියදම් | **28,628** | 21,301 | 8,542 | 12,764 | 12,305 | 29,064 |
| උපාධි අපේක්ෂක පාඨමාලා සඳහා මුළු වියදම් | **120,938** | 101,421 | 93,003 | 92,847 | 88,869 | 94,681 |
| | | | | | | |
| උත්පාදනය කළ ආදායමේ දායකත්වය | 21,836 | 31,120 | 20,226 | 10,237 | - | 5,091 |
| උත්පාදනය කළ ආදායමේ දළ දායකත්වය -% | 14% | 25% | 17% | 10% | 0% | 9% |
| උත්පාදනය කළ ආදායමේ ශුද්ධ දායකත්වය -% | **28%** | 62% | 35% | 18% | 0% | 21% |
| උත්පාදනය කළ ආදායම | **159,429** | 123,267 | 115,690 | 105,426 | 68,494 | 58,981 |
| ව්‍යාප්ත වැඩසටහනන් සඳහා පුනරාවර්තන වියදම් | **80,197** | 73,313 | 58,399 | 47,316 | 40,117 | 35,141 |
| විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘති සඳහා ලද ප්‍රදාන | **6,202** | 93,581 | 104,834 | 70,969 | 35,700 | 46,356 |
| | | | | | | |
| අභ්‍යන්තර ශිෂ්‍යයන් සංඛ්‍යාව | **737** | 739 | 748 | 754 | 584 | 592 |
| සේවකයන් සංඛ්‍යාව | **144** | 151 | 162 | 156 | 147 | 139 |
| ශිෂ්‍යයෙක් සඳහා වියදම වාර්ෂයකට. ( '000 ) | **125** | 108 | 113 | 106 | 131 | 111 |
| සේවකයෙක් සඳහා වියදම වාර්ෂයකට. ( '000 ) | **578** | 457 | 414 | 384 | 372 | 359 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

5 AB

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனதுஇல<br>MyNo | සිර්/සී/යුසීඑස්සී / 2011/එෆ්ඒ | |
| ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | |
| දිනය<br>திகதி<br>Date | 2012 ජුලි 04 දින | |

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

පිටපත් :

1. සභාපති , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. ලේකම් , උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
3. ලේකම් , මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
4. උපකුලපති , කොළඹ විශ්වවිද්‍යාලය


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல.306/72,பொல்துவ வீதி, புத்தரமுல்லை, இலங்கை.
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனதுஇல / MyNo: සිඊ/සී//යූසීඑස්සී / 2011/එෆ්ඊ

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2012 ජුලි 04 දින

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඊ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(7)(ඊ) වගන්තිය ප්‍රකාර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිණිස අවශ්‍යයයි කළමණාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல.306/72,பொல்துவ வீதி, புத்தரமுல்லை, இலங்கை.
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

1.3 විගණනකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්වාගනණය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්වාගනණය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

සමාලෝචිත වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ගිණුම් විගණනය කිරීමෙන් පසුව 2012 ජුනි 06 දින කෙටුම්පත් වාර්තාව නිකුත් කරන ලදී. කෙටුම්පත් වාර්තාවේ රු.49,129,601 ක ගිණුම්කරණ අඩුපාඩු පෙන්වා දුන් අතර එම ගිණුම්කරණ අඩුපාඩු සියල්ල නිවැරදිකර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 06 දින ඉදිරිපත් කරන ලදී. තෝරාගන්නා ලද නියැදියෙන් බාහිරව තවදුරටත් මෙවැනි අඩුපාඩු තිබීම විගණනයේදී බැහැර කළ නොහැක.

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18(14) පරිච්ඡේදයට අනුව සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය දීර්ඝවීමක් පවතීනම් එම වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂයවී තිබූ පිරිවැය රු2,775,000 ක් වූ වෑන් රථය එසේ ප්‍රත්‍යාගනනය කර නොතිබුණි.

### 2.2.2. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් අනුව පිරිවැය වටිනාකම රු.413,404,222 ක් වූ ස්ථාවර වත්කම් සත්‍යාපනය කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 371 | සමාලෝචිත වර්ෂය අවසානයේ ආයතනයේ නිලධාරීන් විසින් ලබාගෙන තිබූ කල් ඉකුත්වූ වසර 5 ඉක්මවා තිබූ රු.289,046 ක් වූ ආපදා ණය සහ රු.5900 ක් වූ උත්සව අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2008 දෙසැම්බර් 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 142 හා 2009 පෙබරවාරි 05 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2/2009 | 2009 ජනවාරි 01 දිනෙන් පසුව ලබාදෙන ආපදා ණය උපරිම සීමාව රු.250,000 වියයුතු වුවත් නිලධාරීන් 08 දෙනෙකුට එම සීමාව ඉක්මවා රු.763,200 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 95 | වැටුපට අමතරව වෙනත් දීමනා ලබා ගැනීමේදී ආයතන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව නිලධාරීන් 03 දෙනෙකු සඳහා ව්‍යාපෘති මූල්‍ය හා පරිපාලන දීමනා ලෙස රු.119,500 ක් ගෙවා තිබු ණි. |

2.2.3. ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/98, 29/98(i), 07/2007(i) හා 02/2009 ට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි අංක 6/2003 ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනතාවය වෙනුවෙන් 2011 වර්ෂයේදී රු.69,111 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.9,569,004 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේදී ඌනතාවය රු.23,870,170 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු.83,102,728 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.73,533,724 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.65,381,575 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌනතාවය රු.41,511,405 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රු. 32,022,319 ක වර්ධනයක් ඇතිවීම සඳහා පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන රු.17,721,153 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

අරමුදල් ඌණ උපයෝජනය

උපාධිධාරි වැඩසටහනෙහි වැය නොකළ තොරතුරු තාක්ෂණ (IT Grant Unspent) ප්‍රදාන වටිනාකම රු.895,466 ක් වූ අතර එම මුදල වසර තුනකට වැඩි කාලයක් තිස්සේ අවලව පැවතුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය

5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2008 සහ 2009 වාර්ෂික වාර්ථා 2011 සැප්තැම්බර් 16 වැනි දිනැතිව ප්‍රමාද වී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට භාර දී තිබුණි. 2010 වර්ෂයේ වාර්ෂික වාර්ථා 2012 මාර්තු 08 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. රාජ්‍ය ව්‍යවසාය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5.1 ජේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ආයතනයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කලයුතු වේ.

(අ) අත්තිකාරම්
(ආ) ගිණුම්තැබීම
(ඇ) අරමුදල් උපයෝජනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

# කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

# 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ විගණකාධිපති වාර්තාව සමග බැඳෙන අපගේ පිළිතුරු ප්‍රකාශය

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

මෙහි සඳහන් ගිණුම්කරණ අඩුපාඩුවල වටිනාකමට විගණකවරුන් විසින් නිසි පරිදි තුලනය කර නොගන්නා ලද ගිණුම් ශේෂ ද ඇතුලත් වූ අතර ඒවා ඔවුන්ට පෙන්වා දෙන ලදී.

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට අනුව එක් එක් වත්කම නැවත ප්‍රත්‍යාගණනය කිරීමක් කළ යුතු බවට සඳහන් නොකරන ලද අතර එම වත්කම් වර්ගයට අයත් සියලු වත්කම් (Entire class of Asset) ප්‍රත්‍යාගණනය කළ යුතු බවට දන්වයි. කෙසේ වෙතත් වත්කම් ප්‍රත්‍යාගණනය තුලින් සංචිත ප්‍රමාණයේ ඉහළ යාමක් පමණක් සිදුවන අතර, දැරීමට සිදුවන වියදම් හා බැලීමේදී එතරම් වාසිදායක තත්ත්වයක් ආයතනයට ඇති නොවේ.

2.2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) මු.රෙ. 756 ට අනුව 2011 වර්ෂයේදී ස්ථාවර වත්කම් සත්‍යාපනයක් කරන ලද අතර එය නිසි පරිදි සම්පූර්ණ නොකරන ලදී. එහෙත් 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද සත්‍යාපනය දැනට නිසි පරිදි සිදුවෙමින් පවතී.

(ආ) විදේශගත වී ඇති කථිකාචාර්ය මණ්ඩලයේ නිලධාරීන් නැවත සේවයට වාර්තා නොකරන ලද හෙයින් මෙකී ණය අය කර ගැනීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් ඔවුන්ගේ වි.වි.සේ.අ.අ. අයකර ගැනීමට කටයුතු යොදවමින් සිටී.

(ඇ) විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ඇති සේ.අ.අ. ණය ක්‍රමය හැරුණු විට ඇති එකම ණය යෝජනා ක්‍රමය වන්නේ ආපදා ණය ක්‍රමය පමණි. චක්‍රලේඛයට අනුව රජයේ අරමුදල් වලින් රු. 250,000/- පමණක් ලබා දෙන අතර අභ්‍යන්තර ඉපයීම් වලින් ඉතිරි ප්‍රමාණය ලබා දේ. මෙකී ණය ඉල්ලීම් වලට රජයේ ප්‍රතිපාදනයට අමතරව අභ්‍යන්තරිකව උපයන ලද මුදල් වලින් ප්‍රතිපාදන ලබා ගැනීමට කළමනාකරණ මණ්ඩලයට ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවේ එහි නිගමනය වූයේ ආයතනයේ පවතිතන මෙහෙයුම් ක්‍රියාවලිය සලකා බලන විට මෙම ක්ෂේත්‍රයේ නිපුණතා ඇති අය තවදුරටත් ආයතනය වෙත රඳවා ගැනීමේ අභිප්‍රේරණ ක්‍රමයක් ලෙස ( Motivation) මෙම සම්පූර්ණ ණය මුදලම ලබා දියයුතු බවයි.

(ඈ) ආයතනය විසින් විදේශ අරමුදලින් ක්‍රියාත්මක වන විදේශ ව්‍යාපෘති ගණනාවක් පවත්වා ගෙන යනු ලබන අතර ඒවායේ ගිණුම්මය හා පරිපාලන කටයුතු ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් ලවා ඉටු කරවා ගනී. ඒ වෙනුවෙන් ඉතාමත් වාසිදායක පදනම මත ඔවුන්ට මාසිකව දීමනාවක් ගෙවනු ලැබේ. පිටතින් සේවකයින් බඳවා ගෙන මෙම කාර්යය ඉටු කරවා ගැනීමට සිදු වුවහොත් ඒ සඳහා මෙයට වඩා විශාල වියදමක් දැරීමට සිදු වේ. මේ ගැන ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.

2.2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

තෙවන හා දෙවන භාෂා ප්‍රවීණත්වය වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන ලිපි 6/2003 ප්‍රකාරව මෙම දීමනාව ගෙවන ලදී.

4. අරමුදල් ඌණ උපයෝජනය

තොරතුරු තාක්ෂණ ප්‍රදාන යටතේ ලද මුදලින් මේ දක්වා වියදම් නොකල ප්‍රමාණය 2012 වර්ෂයේ දී වියදම් කිරීමට කටයුතු යොදවමින් සිටී.

5. වාර්ෂික වාර්තාව සභාගත කිරීම

වාර්ෂික වාර්තාව ඇතුලත් විය යුතු ප්‍රධාන අංගයක් වන්නේ විගණිත මූල්‍ය ප්‍රකාශන (Audited Financial Statement ) හා විගණන වාර්තාවයි. මෙකී මූලික අවශ්‍යතාවයන් දෙක සම්පූර්ණ නොවන හෙයින් අවසාන ගිණුම් සමග වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය.

කෙසේ වෙතත් කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් 2012.07.13 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

6. පද්ධති හා පාලන

මෙහි සඳහන් කර ඇති අංශ කෙරේ අවධානය යොමු කිරීමට කටයුතු කරමි.

ස්තුතියි

මෙයට

මහාචාර්ය ගිහාන් වික්‍රමනායක

අධ්‍යක්ෂක